
රහස්‍ය ලේඛනයකි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**අ.පො.ස. (උ. පෙළ) විභාගය - 2024**

# 21 - ආර්ථික විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තර පත්‍ර පරීක්ෂවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂකවරුන් සමග සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි ඇතැම් වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# පටුන


| | පිටුව සිට | | දක්වා |
|---|---|---|---|
| උත්තර පත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම | 02 | - | 03 |
| ප්‍රශ්න පත්‍ර ව්‍යුහය | 04 | - | 04 |
| ආර්ථික විද්‍යාව I ප්‍රශ්න පත්‍රය | 05 | - | 12 |
| ආර්ථික විද්‍යාව I සඳහා ලකුණු දීමේ පටිපාටිය | 13 | - | 13 |
| ආර්ථික විද්‍යාව II සඳහා ලකුණු දීමේ පටිපාටිය | 14 | - | 55 |

සටහන් 56




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී පැහැදිලි ඉලක්කමෙන් ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් මේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ...................................................................
...................................................................  √  △ $\frac{4}{5}$
...................................................................

(ii) ...................................................................
...................................................................  √  △ $\frac{3}{5}$
...................................................................

(iii) ...................................................................
...................................................................  √  △ $\frac{3}{5}$
...................................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

### බහුවරණ උත්තරපත්‍ර ( කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් ඉඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණ කින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඉඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# (21) ආර්ථික විද්‍යාව

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I** පත්‍රය - කාලය පැය 02 යි.
වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 01 ක බැගින් මුළු ලකුණු 50 කි.

**II** පත්‍රය - කාලය පැය 03 යි.
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.
(අ) උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 5 කි.
(ආ) උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 5 කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 2 බැගින් තෝරා ගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම : **I** පත්‍රය 50

**II** පත්‍රය 100

අවසාන ලකුණු $50 + \left(\frac{100}{2}\right) = 100$



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂය අංකය / பாட இலக்கம் **21** විෂය / பாடம் **ආර්ථික විද්‍යාව**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 5 | 31. | 1 | 41. | 1 |
| 02. | 5 | 12. | 3 | 22. | 1 | 32. | 1 | 42. | 2 |
| 03. | 1/2 | 13. | 4 | 23. | 4 | 33. | 3 | 43. | 1 |
| 04. | 3 | 14. | 5 | 24. | 4 | 34. | 3 | 44. | 3 |
| 05. | 2 | 15. | 4 | 25. | 2 | 35. | 1 | 45. | 1 |
| 06. | 4 | 16. | 5 | 26. | 4 | 36. | 1 | 46. | 3 |
| 07. | 5 | 17. | 2 | 27. | 4 | 37. | 4 | 47. | 5 |
| 08. | 2 | 18. | 5 | 28. | 3 | 38. | 5 | 48. | 1 |
| 09. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 2 | 49. | 5 |
| 10. | 4 | 20. | 2 | 30. | 2 | 40. | 2 | 50. | 2 |

○ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 x 50 = 50



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

**'අ' උප කොටස**

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) ආර්ථික සම්පත් සහ නොමිල සම්පත් නිර්වචනය කර, එක් එක් කාණ්ඩයට උදාහරණ **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04යි)

(ii) 'ශ්‍රමය' සහ 'ව්‍යවසායකත්වය' අතර පවත්නා ප්‍රධාන වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(iii) නිෂ්පාදන හැකියා වක්‍රය සරල රේඛාවක් විය හැක්කේ කුමන කොන්දේසි යටතේ ද? (ලකුණු 03යි)

(iv) විධාන ආර්ථික පද්ධතියක් සහ වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් තුළ රජයේ කාර්යභාරය සංසන්දනය කරන්න. (ලකුණු 04යි)

(v) හිඟකම පිළිබඳ ගැටලුව වෙළෙඳපොළ, විධාන හා මිශ්‍ර ආර්ථික පද්ධති මගින් විසඳන ආකාරය පැහැදිලි කොට, එකී ප්‍රවේශයන්ගේ සඵලතාව අගයන්න. (ලකුණු 06යි)

01. (i) - ආර්ථික සම්පත් යනු සැපයුම සීමාසහිතවූත් ඒවා ලබා ගැනීමට හෝ නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට හෝ මානුෂ ප්‍රයත්නයක් හෝ ප්‍රාග්ධනයක් අවශ්‍ය කරන්නාවූත් සම්පත් ය.

- ඉල්ලුමට සාපේක්ෂව ඒවායේ සැපයුම සීමාසහිත බැවින් මෙම සම්පත් භාවිතය හා සම්බන්ධ ආවස්ථික පිරිවැයක් දක්නට ලැබේ. (ලකුණු 01යි)

- නිදසුන් : 1. ඛණිජ තෙල් 2. ශ්‍රමය 3. දැව (ලකුණු 01යි)

- ආර්ථික නොවන (නොමිල) සම්පත් යනු ස්වභාවික පරිසරය තුළ සුලබව දක්නට ලැබෙන, මානුෂ ප්‍රයත්නයකින් හෝ පිරිවැයකින් හෝ තොරව ලබා ගත හැකි සම්පත් ය.

- ශුන්‍ය මිලකදීත් ඒවායේ සැපයුම ඉල්ලුම ඉක්මවා යන බැවින් වෙළෙඳපොළ තුළ ඒවා ආශ්‍රිතව හිමිකාරිත්වයක් හෝ ගනුදෙනුවීමක් හෝ සිදු නොවේ. (ලකුණු 01යි)

- නිදසුන් : 1. වාතය 2. හිරුඑළිය 3. ගුරුත්ව බලය (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(ii) ශ්‍රමය සහ ව්‍යවසායකත්වය අතර ප්‍රධාන වෙනස්කම් :

- නිෂ්පාදන ක්‍රියාවලියේ දී පුද්ගලයන් සපයනු ලබන කායික හෝ මානසික ප්‍රයත්නය ශ්‍රමය ලෙස සැලැකේ.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ව්‍යවසායකත්වය යනු ව්‍යාපාරයක් සංවිධානය, කළමනාකරණය සහ අවදානම් දැරීම සඳහා පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් හෝ විසින් කරනු ලබන මූලපිරීමයි. භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යවසායකයෝ භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය වැනි සෙසු නිෂ්පාදන සාධක සම්බන්ධීකරණය කරති.

- ව්‍යාපාරයක තීරණ ගැනීමේ දී හා අවදානම් දැරීමේ දී ශ්‍රමිකයන්ට ඇත්තේ සීමිත වගකීමකි. ඔවුන් වැඩ කරනුයේ කළමනාකරුවන් සහ ව්‍යවසායකයන් ලබා දෙන නියෝග මත වන අතර ඒ කාර්යය සඳහා සාමාන්‍යයෙන් ස්ථිර වැටුපක් හෝ වේතනයක් ගෙවනු ලැබේ.
  ව්‍යවසායකයෝ විභව ලාභ උදෙසා ඉතා ඉහළ මට්ටමක අවදානම් දරති. ඔවුහු උපාය මාර්ගික තීරණ ගන්නා අතර ව්‍යාපාරය සඳහා ප්‍රාග්ධනය ආයෝජනය කරති. එසේම ව්‍යාපාරය අසාර්ථක වුවහොත් විශාල මූල්‍ය අවදානමක් ද දරති.

- ශ්‍රමිකයන්ගේ ඉපයීම වැටුප් හෝ වේතන වේ. ඔවුන් යොදන ප්‍රයත්නය හා කාලය මත එය තීරණය වේ. ව්‍යවසායකයන්ගේ ඉපයීම ලාභයයි. ව්‍යාපාරයේ අයභාරයෙන් සියලු පිරිවැය අඩු කළ පසුව ශේෂවන ප්‍රමාණය ලාභයයි.

- ශ්‍රමයට නිශ්චිත කුසලතා සහ සුදුසුකම් අවශ්‍ය විය හැක. කම්කරුවන් සාමාන්‍යයෙන් පුනරාවර්තන කාර්යයන් සඳහා පුහුණු කරනු ලබන අතර, ස්ථාපිත ක්‍රියාපටිපාටි අනුගමනය කළ හැකි ය.
  ව්‍යවසායකත්වය සඳහා නිර්මාණශීලීත්වය, නවෝත්පාදන සහ අවදානම් ගැනීම අවශ්‍ය කෙරේ. ව්‍යවසායකයන් බොහෝ විට තරඟකාරී වාසියක් ලබා ගැනීම සඳහා නව නිෂ්පාදන නිර්මාණය කිරීමට හෝ පවත්නා ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීමට උත්සාහ කරන දූරදර්ශී දැක්මක් ඇති පිරිසකි.

- සාමාන්‍යයෙන් ශ්‍රමය අභිප්‍රේරණය වනුයේ රැකියාවේ සුරක්ෂිතතාව, වැටුප් සහ ප්‍රතිලාභ මත ය. ව්‍යවසායකත්වය බොහෝ විට අභිප්‍රේරණය වනුයේ විභව ලාභ, නිදහස, සුවිශේෂී යමක් නිර්මාණය කරමින් නව්‍යතාවක් හඳුන්වාදීමේ ආශාව මත ය.

- නිෂ්පාදනය සඳහා අවශ්‍ය ශ්‍රම බලකාය සැපයීම සහ ව්‍යාපාර ක්‍රියාත්මක වීමට හැකියාව ලබා දීම මගින් ශ්‍රමය ආර්ථික වෘද්ධියට දායක වේ.
  නව නිපැයුම්, සේවා සහ ක්‍රියාවලීන් හඳුන්වා දීම, රැකියා අවස්ථා උත්පාදනය කරදීම, තරඟකාරී වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීම මගින් ව්‍යවසායකත්වය ආර්ථික වෘද්ධියට සැලකිය යුතු දායකත්වයක් සපයයි.

**(එක් වෙනසක්කමකට ලකුණු 01 බැගින් වෙනස්කම් තුනකට ලකුණු 03යි)**

**(මුළු ලකුණු 03යි)**

(iii) - ස්ථාවර ආවස්ථික පිරිවැය : ආවස්ථික පිරිවැය ස්ථාවර වීම යන්නෙන් අදහස් කරනුයේ නිෂ්පාදනය කරනු ලබන එක් භාණ්ඩයක අතිරේක ඒකකයක් සඳහා අනික් භාණ්ඩයෙන් කැපකරනු ලබන ප්‍රමාණය ස්ථාවරව පවත්නා බව ය. **(ලකුණු 01යි)**

- සම්පත් පූර්ණ ආදේශක වීම : භාණ්ඩ දෙවර්ගය ම නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගැනෙන ශ්‍රමය, ප්‍රාග්ධනය, අමුද්‍රව්‍ය වැනි සම්පත් එක හා සමාන කාර්යක්ෂමතාවෙන් යුක්ත වේ නම් එක් භාණ්ඩයක සිට තවත් භාණ්ඩයක් කරා සම්පත් මාරු කිරීමෙන් ආවස්ථික පිරිවැයෙහි කිසිදු වෙනසක් නොවේ. **(ලකුණු 01යි)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- සම්පත් සමජාතීය වීම : සම්පත් සමජාතීය වේ නම් (එනම් භාණ්ඩ දෙකෙහිම නිෂ්පාදනය සඳහා යොදා ගැනෙන සම්පත්, කුසලතා, ගුණාත්මකභාවය සහ ඵලදායිතාව යන කරුණු වලින් සමාන වේ නම්) නිෂ්පාදනය එක් භාණ්ඩයක් වෙතින් තවත් භාණ්ඩයකට මාරු වුවද ආවස්ථික පිරිවැය නොවෙනස් ව පවතී. මෙම සාධක සමජාතිය ස්වභාවය, හීනවනඵල හටගැනීම වළක්වයි. (ලකුණු 01යි)

(මුළු ලකුණු 03යි)

(iv) - සම්පත් සහ නිෂ්පාදනය පිළිබඳ තීරණ ගැනීම.

විධාන ආර්ථිකයක් තුළ සම්පත් හා නිෂ්පාදන තීරණ පිළිබඳ පූර්ණ පාලනය රජය සතුවේ. නිෂ්පාදනය කරන්නේ කුමන භාණ්ඩ හා සේවා ද, ඒවා නිෂ්පාදනය කරන්නේ කෙසේ ද සහ ඒවා ලැබෙන්නේ කා හට ද යන්න රජය තීරණය කරයි. මෙම මධ්‍යගත සැලසුම් ප්‍රවේශය පුද්ගල මනාපයන්ට ප්‍රතිචාර දැක්වීමට වඩා ජාතික ඉලක්ක සපුරාලීම අරමුණු කරයි.

වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ නිෂ්පාදන තීරණ ගැනීමේ දී රජයට ඇත්තේ සීමිත කාර්ය භාරයකි. සැපයුම සහ ඉල්ලුම මත පදනම් ව සම්පත් බෙදා වෙන්කිරීම සිදුවන අතර ලාභය උපරිම කිරීම සඳහා ව්‍යාපාරික ආයතන ස්වාධීන නිෂ්පාදන තීරණ ගනී. රජය මැදිහත් වන්නේ වෙළෙඳපොළ අසාර්ථක වූ විට හෝ ආරක්ෂාව හෝ යටිතල පහසුකම් සැපයීම වැනි අත්‍යවශ්‍යයයි සැලකෙන අංශවල පමණි.

- සම්පත් හිමිකාරිත්වය :

විධාන ආර්ථිකයක් තුළ රජයට සාමාන්‍යයෙන් කර්මාන්ත ශාලා, ඉඩම් සහ ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන මාධ්‍යයන් සියල්ලම නොවේ නම් බොහෝමයක් හිමිවේ. පෞද්ගලික හිමිකාරිත්වයක් නැති තරම් වන අතර පෞද්ගලික ව්‍යවසාය බොහෝ විට සීමාකර හෝ නියාමනය හෝ කරනු ලැබේ.

වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ බොහෝ සම්පත් පෞද්ගලික හිමිකාරිත්වය යටතේ පවතී. දේපළ හිමිකර ගැනීමට විකිණීමට හා මිල දී ගැනීමට නිදහස පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ඇත.

- ආර්ථික ඉලක්ක සහ අරමුණු :

විධාන ආර්ථිකයක් තුළ රජය පූර්ණ සේවා නියුක්තිය, මිල ස්ථායිතාව, සාධාරණ ආදායම් ව්‍යාප්තිය වැනි අරමුණු ජාතික ඉලක්ක වශයෙන් සකසා ඒවාට ප්‍රමුඛතාව ලබා දෙයි. ආර්ථික සැලසුම් බොහෝ විට දිගුකාලීන වන අතර පෞද්ගලික ලාභ චේතනාවලට වඩා සමාජ සුභසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි.

වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ආර්ථික ඉලක්ක බොහෝ දුරට තීරණය වන්නේ පුද්ගලයන් සහ ව්‍යාපාර තම තමන්ගේ ස්වාර්ථය උදෙසා කරනු ලබන ක්‍රියාමාර්ග මතය. ආර්ථික වර්ධනය, කාර්යක්ෂමතාව සහ නවෝත්පාදන පෞද්ගලික අංශය මෙහෙයවයි. රජයේ කාර්ය භාරය වනුයේ සාමාන්‍යයෙන් නීති ක්‍රියාත්මක කිරීම, දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ පොදු භාණ්ඩ සැපයීම වැනි වෙළෙඳපොළට සාර්ථකව ක්‍රියාත්මක විය හැකි ස්ථාවර පරිසරයක් සහතික කිරීමයි.

- මිලකරණය :

විධාන ආර්ථිකයක් තුළ මිල නියම කරනු ලබන්නේ වෙළෙඳපොළ බලවේගවලට වඩා රජය විසිනි.

වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ නිෂ්පාදකයන්ට සහ පාරිභෝගිකයන්ට ආර්ථික තීරණ ගැනීමට සංඥා සපයන මිල ගණන් තීරණය වනුයේ සැපයුම හා ඉල්ලුම මත ය. ඒකාධිකාර



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

නියාමනය කිරීම හෝ අවම වැටුප් නීති සැකසීම වැනි විශේෂිත අවස්ථාවන්හි දී හැර රජය සාමාන්‍යයෙන් මිල යන්ත්‍රණයට බාධා නොකරයි.

- ආදායම් ව්‍යාප්තිය :
විධාන ආර්ථිකයක් තුළ ආර්ථික අසමානතාව අවම කිරීම ඉලක්ක කර ගනිමින් ආදායම් බෙදීයාම සාමාන්‍යයෙන් රජය විසින් පාලනය කරනු ලැබේ. වැටුප්, මිල ගණන්, සමාජ ප්‍රතිලාභ බොහෝ විට රජය විසින් වඩා සාධාරණ ව්‍යාප්තියක් සහතික කිරීම සඳහා සකසනු ලැබේ.
වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ආදායම් බෙදාහැරීම සාමාන්‍යයෙන් වෙළෙඳපොළ බලවේගවලට තීරණය කිරීමට ඉඩ හැර තිබේ. කුසලතා, ඵලදායිතාව සහ ආයෝජනය වැනි කරුණු මත පදනම්ව වඩාත් අසමාන ව්‍යාප්තයක් ඇති කරයි. අසමානතාව අවම කිරීම සඳහා අනුක්‍රම බදුකරණය, සුභසාධන වැඩසටහන් හෝ සහනාධාර ඔස්සේ රජයට මැදිහත් විය හැකි ය.

- නවෝත්පාදන සහ ආයෝජනයේ කාර්යභාරය :
විධාන ආර්ථිකයක් තුළ ආයෝජනය සහ නවෝත්පාදන රජය විසින් සැලසුම්කරනු ලබන අතර එමගින් ජාතික ප්‍රමුඛතා මත පදනම් ව නිශ්චිත කර්මාන්ත හෝ තාක්ෂණයන් සඳහා අරමුදල් වෙන් කළ හැකි ය.

- වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ නවෝත්පාදන සහ ආයෝජනය මෙහෙයවනු ලබන්නේ ලාභ අපේක්ෂා කරන පෞද්ගලික ව්‍යාපාර සහ ව්‍යවසායකයන් විසිනි.

(එක් සංසන්දනයකට ලකුණු 01 බැගින් සංසන්දන හතරකට ලකුණු 04යි)

(මුළු ලකුණු 04යි)

(v) වෙළෙඳපොළ ආර්ථිකය

**හිඟකම ප්‍රශ්නයට ප්‍රවේශය :-**

- වෙළෙඳපොළ ආර්ථිකයක හිඟකම ප්‍රශ්නය කළමනාකරණය කරනුයේ මූලික වශයෙන් වෙළෙඳපොළ යන්ත්‍රණය ඔස්සේ ය. මිල මගින් ලබා දෙන සංඥා ඔස්සේ ඉල්ලුම හා සැපයුම පදනම් කර ගෙන සම්පත් බෙදා වෙන්කිරීම සිදුවේ. සම්පතක් හෝ භාණ්ඩයක් හිඟකමක් පෙන්නුම් කරන්නේ නම්, ඒවායේ මිල ඉහළ නගින අතර ඒවායේ පරිභෝජනය අධෛර්යමත් වන අතර ඒවායේ සැපයුම වැඩිකිරීමට නිෂ්පාදකයන් දිරිගන්වනු ලැබේ. ඒ ආකාරයටම කිසියම් භාණ්ඩයක් හෝ සම්පතක් සුලබව ඇත්නම් එහි මිල පහළ බසින අතර එහි නිෂ්පාදකයන්ට නිෂ්පාදනය වැඩි කිරීම ආකර්ශණීය නොවන අතර පාරිභෝගිකයන් එය වැඩියෙන් මිල දී ගැනීමට පෙළඹෙනු ඇත. (ලකුණු 01යි)

**සඵලතාව :**

- සැපයුමේ සහ ඉල්ලුමේ හට ගන්නා වෙනස්කම් කෙරෙහි ප්‍රතිචාර දක්වීමේ ලා වෙළෙඳපොළ ආර්ථිකයක් වඩාත් ඉහළ කාර්යක්ෂමතාවක් පෙන්නුම් කරයි. තමන්ට වඩාත් වැඩි වටිනාකමක් ලබා දෙන දෑ සඳහා පාරිභෝගිකයන් ඉහළ මිලක් ගෙවීමට කැමැත්තක් දක්වන නිසාත් ඒ අනුව නිෂ්පාදකයන් ඒ සඳහා ප්‍රතිචාර දක්වන නිසාත් සීමිත සම්පත් වඩාත් ඉහළ වටිනාකමක් ගෙන දෙන භාවිතයන් සඳහා බෙදා වෙන් කිරීම මිල යාන්ත්‍රණය සහතික කරයි.

- අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟකම සාධාරණ අන්දමින් ඇමැතීමට වෙළෙඳපොළ ආර්ථිකය අසමත් වේ. ඉහළ ආදායම් ඇති අයට එවැනි භාණ්ඩ කරා පහසුවෙන් ප්‍රවේශ විය හැකි



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අතර අඩු ආදායම් ඇති අය ප්‍රවේශ වීම බැහැර කරනු ලැබේ.

- පිරිසිදු වාතය වැනි පොදු භාණ්ඩ ප්‍රමාණවත් පරිදි සැපයීමට වෙළෙඳපොළ ආර්ථිකය අසමත් වනු ඇත. පරිසර දූෂණය වැනි බාහිරතා ගැටලු ද ප්‍රමාණවත් පරිදි ආමන්ත්‍රණය කිරීමට අසමත් වනු ඇත. (ලකුණු 01යි)

විධාන ආර්ථිකය

හිඟකම ප්‍රශ්නයට ප්‍රවේශය :

- විධාන ආර්ථිකයක රජය මධ්‍යගත සැලසුම්කරණය ඔස්සේ සම්පත් බෙදා වෙන්කිරීම පාලනය කරයි. කවර භාණ්ඩ කවර ප්‍රමාණයක් කෙබඳු මිලයන් යටතේ නිෂ්පාදනය කළ යුතු ද යන්න සැලසුම් අධිකාරිය තීරණය කරයි.

  පෞද්ගලික ඉල්ලුම හෝ වෙළෙඳපොළ සංඥා මත පදනම් නොවී ජාතික ප්‍රමුඛතා සහ සමාජ අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයට සම්පත් බෙදා වෙන්කිරීමට රජය අරමුණු කරයි. (ලකුණු 01යි)

- සඵලතාව :

  මූලික අවශ්‍යතා සපුරාලමින් සම්පත් වඩාත් සාධාරණ ලෙස බෙදී යාම න්‍යායාත්මකව තහවුරු කිරීමට විධාන ආර්ථිකයකට පිළිවන. නිෂ්පාදනය හා බෙදා හැරීම සැලසුම් කිරීම මගින් ප්‍රධාන කර්මාන්තවලට සම්පත් යොමු කිරීමටත් පුද්ගලයන්ගේ ආදායම් මට්ටම් නොසලකා අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැමට ලබා දීමට සම්පත් යොමු කිරීමටත් හැකි වේ.

- විධාන ආර්ථික බොහෝ අවස්ථාවල අකාර්යක්ෂමතා ගැටලුවලට මුහුණ දේ. වෙළෙඳපොළ ආර්ථිකයක දක්නට ලැබෙන ගතික සංවේදිතාව මධ්‍යගත සැලසුම්කරණයක් තුළ දක්නට නැත. පාරිභෝගිකයන්ගේ සැබෑ වරණයන් නොසලකා තීරණ ගනු ලබන නිසා වෙළෙඳපොළේ අතිරික්තයක් සහ හිඟ නිතර පැන නගී. ඇතැම් විට දිගින් දිගටම හිඟයක් පෙන්නුම් කරන අතර ඇතැම් විට අධි නිෂ්පාදනයක් පෙන්නුම් කරමින් සම්පත් නාස්තියකට ඉඩ සලසයි. (ලකුණු 01යි)

මිශ්‍ර ආර්ථික

හිඟකම ප්‍රශ්නයට ප්‍රවේශය :

- හිඟකම ප්‍රශ්නය ඇමැතීම සඳහා මිශ්‍ර ආර්ථික පද්ධතියක් වෙළෙඳපොළ ආර්ථිකයේ සහ විධාන ආර්ථිකය යන දෙකෙහිම දක්නට ලැබෙන ගුණාංග සංකලනය කර ගනී. කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තේරීම වඩා වැදගත් වන අවශේෂ ක්ෂේත්‍ර මිල යාන්ත්‍රණයේ මඟ පෙන්වීම ඔස්සේ පෞද්ගලික අංශය මෙහෙයවයි. (ලකුණු 01යි)

- සඵලතාව :

  වෙළෙඳපොළ අසමත් විය හැකි සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, පරිසරය ආරක්ෂා කිරීම වැනි පොදු භාණ්ඩ හා සේවා රජය බොහෝ දුරට සපයමින් හිඟකම පිළිබඳ ප්‍රශ්නය අමතයි. කාර්යක්ෂමතාව සහ සමාජ සාධාරණත්වය යන අරමුණු අතර තුලනයක් ඇතිකිරීමට මිශ්‍ර ආර්ථික පද්ධතිය සමත් වේ.

- කෙසේ වෙතත් රජයේ මැදිහත්වීම සහ වෙළෙඳපොළේ නිදහස අතර නිවැරදි තුලනය ඇති කර ගැනීම මිශ්‍ර ආර්ථික පද්ධතියක් මුහුණ දෙන ප්‍රබල අභියෝගයකි. උවමනාවට වඩා වෙළෙඳපොළට මැදිහත් වීම නිසා නවෝත්පාදන බිහිවීමට සහ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම බිඳවැටිය හැකි ය. අනික් අතට ප්‍රමාණවත් පරිදි මැදිහත් නොවීම නිසා අසමානතාව හා වුවමනා තෘප්තිමත් නොවීම හටගනු ඇත. (ලකුණු 01යි)

(මුළු ලකුණු 06යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**2.** (i) පෞද්ගලික ඉල්ලුම් වක්‍රවලින් වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කරගන්නා ආකාරය රූපසටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) ඉල්ලුමේ මිල නම්‍යතාව යන්නෙන් කවරක් අදහස් වේ ද? මුළු අයභාරයට එය බලපාන්නේ කෙසේ ද? (ලකුණු 03යි)

(iii) භාණ්ඩයක වෙළෙඳපොළ සැපයුම් වක්‍රය කෙරෙහි බලපෑම් කළ හැකි රජයේ ප්‍රතිපත්ති උපකරණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(iv) වෙළෙඳපොළ සමතුලිතතාව පිළිබඳ සංකල්පය නිර්වචනය කොට වෙළෙඳපොළ අසමතුලිතතාවක් සමතුලිතතාව කරා රැගෙන යන බලවේග පැහැදිලි කරන්න. (ලකුණු 04යි)


(v) (අ) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ඉල්ලුමේ මිල නම්‍යතාව පාරිභෝගික අතිරික්තයට බලපානු ලබන්නේ කෙසේ දැයි රූපසටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

02. (i) - වෙළෙඳපොළ ඉල්ලුම යනු අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී, භාණ්ඩය මිල දී ගැනීමට කැමැති සහ මිල දී ගැනීමට හැකියාව ඇති වෙළෙඳපොළේ සියලු ම පාරිභෝගිකයන් විවිධ මිලයන් යටතේ ඉල්ලුම් කරනු ලබන මුළු ප්‍රමාණයන්ය. වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කරනුයේ සියලු ම පෞද්ගලික ඉල්ලුම් වක්‍ර තිරස් අතට එකතු කිරීමෙනි.

(ලකුණු 02යි)

- රූපසටහනෙහි දැක්වෙන්නේ A සහ B යන පෞද්ගලික ඉල්ලුම්කරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වෙළෙඳපොළක ඉල්ලුම් වක්‍ර තිරස් අතට එකතු කිරීමෙන් වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය ලබා ගන්නා ආකරයයි.




$P_1$ මිලේ දී A විසින් $Q_{1A}$ ප්‍රමාණයත් B විසින් $Q_{1B}$ ප්‍රමාණයත් ඉල්ලුම් කරන බැවින් එම මිලේ දී මුළු වෙළෙඳපොළ ඉල්ලුම් ප්‍රමාණය වනුයේ $Q_{1A}$ සහ $Q_{1B}$ යන ප්‍රමාණ දෙකේ ම එකතුවයි. එය වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයේ පෙන්නුම් කරනුයේ Aගේ ඉල්ලුම් වක්‍රයේ 0 සිට $Q_{1A}$ දක්වා ප්‍රමාණ අක්ෂය මත ඇති අගයත් Bගේ ඉල්ලුම් වක්‍රයේ 0 සිට $Q_{1B}$ දක්වා ප්‍රමාණ අක්ෂය මත ඇති අගයත් එකතු කොට $P_1$ මිලේ දී මුළු ඉල්ලුම් ප්‍රමාණය $Q_{1\,A+B}$ වශයෙන් දැක්වීමයි. මුළු ඉල්ලුම් වක්‍රයේ M ලක්ෂයෙන් දැක්වෙන්නේ එම අවස්ථාවයි. මේ අන්දමින් ම $P_2$ මිලේ දී A සහ B මිල දී ගැනීමට කැමති ප්‍රමාණ $Q_{2\ A+B}$ වශයෙන් හඳුනාගෙන එම අගයන් මුළු ඉල්ලුම් වක්‍රයේ N ලක්ෂයෙන් දැක්විය හැකි ය. ඒ අනුව M සහ N ලක්ෂ්‍ය යා කොට සරල රේඛාවක් ඇඳීමෙන් මුළු ඉල්ලුම් වක්‍රය ලබා ගත හැකි ය. $D_{A+B}$ පෙන්නුම් කරනුයේ වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයයි.

(ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)

(ii) - මිල ඉල්ලුම් නම්‍යතාව යන්නෙන් අදහස් වන්නේ කිසියම් භාණ්ඩයක හෝ සේවාවක ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය එම භාණ්ඩයේ හෝ සේවාවේ මිල වෙනස්වීම් කෙරෙහි දක්වන



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සංවේදිතාවයි.

- එය මනිනු ලබන්නේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස, මිලෙහි ප්‍රතිශතාත්මක වෙනසින් බෙදීමෙනි. එය පහත දැක්වෙන ලෙස ප්‍රකාශ කළ හැකි ය.

$$\text{මිල ඉල්ලුම් නම්‍යතාව} = \frac{\text{ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස}}{\text{මිලෙහි ප්‍රතිශතාත්මක වෙනස}}$$

$$= \frac{\Delta Q}{Q} \div \frac{\Delta P}{P}$$

(ලකුණු 01යි)

- මුළු අයභාරයට බලපාන ආකාරය :
- මිල ඉල්ලුම් නම්‍යතාව 1ට වැඩි නම් හෙවත් ඉල්ලුම නම්‍ය වේනම් භාණ්ඩයක මිල අඩු වූ විට මිල අඩු වූ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණය වැඩි වන බැවින් මුළු අයභාරය ඉහළ නගී.
  අනික් අතට මිල වැඩි වූ විට මිල වැඩි වූ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණය අඩු වන බැවින් මුළු අයභාරය අඩු වේ. (ලකුණු 01යි)

- මිල ඉල්ලුම් නම්‍යතාව 1ට අඩු නම් හෙවත් ඉල්ලුම අනම්‍යවේ නම් භාණ්ඩයක මිල අඩු වූ විට මිල අඩු වූ ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණය වැඩි වන බැවින් මුළු අයභාරය අඩු වේ. අනික් අතට මිල වැඩි වූ විට මිල වැඩි වූ ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණය අඩු වන බැවින් මුළු අයභාරය වැඩි වේ. (ලකුණු 01)

(මුළු ලකුණු 03යි)

(iii) - සහනාධාර : සහනාධාරයක් යනු නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා රජය විසින් නිෂ්පාදකයන්ට ලබා දෙන මූල්‍ය අනුග්‍රහයකි.

- වක්‍ර බදු : කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය හෝ අලෙවිය මත රජය විසින් පනවනු ලබන දේශීය භාණ්ඩ බද්ද, එකතු කළ අගය මත බද්ද වැනි බදු ය.

- නියාමන සහ ප්‍රමිති : නිෂ්පාදන ක්‍රියාවලිය ආරක්ෂක ප්‍රමිති (Safety Standards) සහ පරිසර නීති යනාදියට අදාළ ව රජය ක්‍රියාත්මක කරන නියාමනයන්ට අනුගත වීමට නිෂ්පාදකයන්ට සිදුවේ.

- රජයේ නිෂ්පාදනය හෝ තොග රැස්කිරීමේ ප්‍රතිපත්ති : රජය විසින් ම ඇතැම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම මගින් හෝ ඇතැම් භාණ්ඩවල තොග රැස් කොට වරින් වර ඒවා මුදාහැරීම මගින් හෝ රජයට වෙළෙඳපොළ සැපයුමට සෘජු බලපෑමක් කළ හැකි ය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(මුළු ලකුණු 03යි)

(iv) වෙළෙඳපොළ සමතුලිතය :

- වෙළෙඳපොළ සමතුලිතතාව යනුවෙන් අදහස් කරන්නේ වෙළෙඳපොළක් තුළ කිසියම් මිලක දී පාරිභෝගිකයන් යම් භාණ්ඩයක් හෝ සේවාවක් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය එම මිලේ දී නිෂ්පාදකයන් එම භාණ්ඩය හෝ සේවාව සැපයීමට කැමැති ප්‍රමාණයට සමාන වන තත්ත්වයකි.

- එවැනි තත්ත්වයන් යටතේ වෙළෙඳපොළ තුලනය වන අතර, එම හුවමාරුවේ දී



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් දෙපාර්ශ්වය ම තෘප්තිමත් භාවයට පත් වන බැවින් පවත්නා මිල, වෙනස්වීමේ ප්‍රවණතාවක් නොදක්වයි. (ලකුණු 02යි)

වෙළෙඳපොළ සමතුලිතය කරා මෙහෙයවන බලවේග :

- වෙළෙඳපොළ සමතුලිතය කරා මෙහෙයවනුයේ ඉල්ලුමේ සහ සැපයුමේ අන්තර් ක්‍රියාකාරිත්වය තුළින් හටගන්නා අධි සැපයුම් (අතිරික්ත) සහ අධි ඉල්ලුම් (හිඟය) බලවේග මගිනි.

- සමතුලිත මිලට වඩා ඉහළ මිලක් වෙළෙඳපොළේ පවතින විට සැපයුම් කරන ප්‍රමාණය ඉල්ලුම් කරන ප්‍රමාණය ඉක්මවා ගොස් අධි සැපයුමක් ඇති වේ. එහි ප්‍රතිඵලය වන්නේ එම මිලේ දී අලෙවි කර ගත නොහැකි ව කිසියම් භාණ්ඩ ප්‍රමාණයක් වෙළෙඳපොළේ රැඳී තිබීම ය. මෙම අතිරික්ත සැපයුම ඉවත් කරගනු පිණිස මිල පහළ හෙළීමට අලෙවිකරුවෝ පෙළඹෙති. ඒ අනුව ඉහළ ගිය මිල ක්‍රමයෙන් සමතුලිත මිල කරා නැඹුරු වේ. (ලකුණු 01යි)


- සමතුලිත මිලට වඩා පහළ මිලක් වෙළෙඳපොළේ පවතින විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැපයුම් කරන ප්‍රමාණය ඉක්මවා යමින් අධි ඉල්ලුම් තත්ත්වයක් හටගනී. මෙහි දී සීමිත සැපයුම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා ගැනුම්කරුවන් තරගකිරීමේ ප්‍රතිඵල වශයෙන් පහළ වැටුණු මිල යළි සමතුලිත මිල කරා ඉහළට නැඹුරු වේ. මිල ඉහළ යන විට ඉල්ලුම අධෛර්යමත් වී සැපයුම් ප්‍රමාණයට සමාන තත්ත්වයක් කරා ක්‍රමයෙන් ළඟා වේ. අවසානයේ දී අධි ඉල්ලුම ඉවත්ව ගොස් ඉල්ලුම් ප්‍රමාණය සැපයුම් ප්‍රමාණයට සමාන කෙරෙන සමතුලිත මිල හටගනී. (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(v) (අ)- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා පාරිභෝගිකයා ගෙවීමට කැමැති උපරිම මිලත් එම භාණ්ඩය හෝ සේවාව සඳහා ඇත්තවශයෙන් ගෙවන මිලත් අතර ධනාත්මක වෙනස පාරිභෝගික අතිරික්තය ලෙස නිර්වචනය කෙරේ. (ලකුණු 01යි)

- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා නිෂ්පාදකයාට ලැබෙන මිලත් එම භාණ්ඩය හෝ සේවාව සඳහා නිෂ්පාදකයා ලබා ගැනීමට කැමැත්තෙන් සිටි මිලත් අතර වෙනස නිෂ්පාදක අතිරික්තය ලෙස නිර්වචනය කෙරේ. (ලකුණු 01යි)

(ආ)- ඉල්ලුමේ මිල නම්‍යතාව පූර්ණ නම්‍යවේ නම් පාරිභෝගිකයා මිල වෙනස්වීම් කෙරෙහි අපරිමිත සංවේදිතාවක් පෙන්නුම් කරයි. ගැනුම්කරුවා භාණ්ඩයට ගෙවීමට සූදානම් නිශ්චිත මිලකි. ඒ මිලට වඩා ඉහළ මිලකට කිසිවක් මිල දී නොගනී.
එම මිලේ දී පාරිභෝගික අතිරික්තය ශුන්‍ය වේ. (ලකුණු 01යි)




(රූපසටහනට ලකුණු 01යි)




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ඉල්ලුමේ මිල නම්‍යතාව පූර්ණ අනම්‍ය වේ නම් මිල වෙනස්වීම් කෙරෙහි පාරිභෝගිකයා කිසිදු සංවේදිතාවක් නොදක්වයි. ඉල්ලුම්කරන ප්‍රමාණය සඳහා කවර මිලක් වුවද ගෙවීමට සූදානම් බැවින් මෙහිදී පාරිභෝගික අතිරික්තය උපරිම වේ.

- මිල වෙනස්වීම බලපාන්නේ පාරිභෝගික පැහැදමට මිස ඉල්ලුම්කරන ප්‍රමාණයට නොවේ.

(ලකුණු 01යි)




(නිවැරදි රූපසටහනට ලකුණු 01යි)

(මුළු ලකුණු 06යි)

3. (i) විශේෂිත බද්දක් සහ වටිනාකම් බද්දක් (ad-valorem tax) අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(ii) නිදහස් වෙළෙඳපොළක් තුළ සහනාධාරයක් ලබා දීම සහ බද්දක් පැනවීම නිසා ඇතිවන සුබසාධනය අහිමිවීම (deadweight loss) රූපසටහන් යොදා ගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

(iii) උපරිම මිල සීමාවන් පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදක අතිරික්තය සහ සමස්ත ආර්ථික සුබසාධනය මත ඇති කරන බලපෑම විශ්ලේෂණය කරන්න. (ලකුණු 06යි)

(iv) දියර කිරි සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $Q_D = 280 - 2P$ සහ වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය $Q_S = -220 + 3P$ වේ යැයි සලකන්න. (ප්‍රමාණ ලීටර මිලියනවලින් සහ මිල රුපියල්වලින් දැක්වේ.)

(අ) සමතුලිත මිල සහ ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) කිරි ගොවීන් නිෂ්පාදනය කරන සෑම කිරි ලීටරයකට ම රු. 10ක සහනාධාරයක් ලබා දෙන්නේ යැයි සලකන්න. නව සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 04යි)

(ඉ) මෙම තත්ත්වය තුළ මුළු සහනාධාරය ම කිරි ගොවීන්ට හිමි වෙනවා ද? නො එසේ නම් කිරි ගොවීන්ට සත්‍ය වශයෙන් ම හිමිවන්නේ සහනාධාරයෙන් කොපමණ ප්‍රතිශතයක් ද? (ලකුණු 02යි)

03. (i) - විශේෂිත බද්දක් යනු භාණ්ඩයක හෝ සේවාවක එක් එක් ඒකකය මත පනවනු ලබන ස්ථාවර බදු ප්‍රමාණයකි. (උදා : සීනි කිලෝග්‍රෑමයක් මත රු. 10ක බද්දක්.) (ලකුණු 01යි)

- වටිනාකම් බද්දක් යනු භාණ්ඩයක හෝ සේවාවක වටිනාකම හෝ මිල මත ප්‍රතිශතාත්මකව පනවනු ලබන බද්දකි. (උදා : ආපනශාලාවක කෑම ගත් විට කෑමවල වටිනාකම මෙන් 10%ක සේවා ගාස්තුවක්) (ලකුණු 01යි)

(මුළු ලකුණු 02යි)

(ii) බද්දක් නිසා අහිමිවන සුබසාධනය :


- බද්දක් පැනවීම නිසා වෙළෙඳපොළේ හුවමාරුවන භාණ්ඩ ප්‍රමාණය පහළ වැටේ. නිෂ්පාදනය අඩු වේ. සම්පත් භාවිතයේ දී හටගන්නා මෙම අකාර්යක්ෂමතාව අහිමිවන සුබසාධනය ලෙස නම් කෙරේ.

(ලකුණු 01යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- මෙය රූපසටහනෙහි දැක්විය හැකි ය.





බද්දට පෙර හුවමාරු වූ සමතුලිත ප්‍රමාණය $Q_1$ වූ අතර බද්දට පසු හුවමාරු වන ප්‍රමාණය $Q_2$ දක්වා පහළ වැටී ඇත. බද්දට පෙර පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් හිමිකර ගත් ආර්ථික අතිරික්තයෙන් ABC ත්‍රිකෝණයෙන් දැක්වෙන ප්‍රමාණය බද්දට පසු ඔවුනට අහිමි වී ඇත. ABC ප්‍රමාණයෙන් අහිමි වූ ආර්ථික අතිරික්තය, අහිමි වූ සුබසාධනය ලෙස සැලකේ.

(ලකුණු 01යි)

සහනාධාරය නිසා අහිමිවන සුබසාධනය :

- සහනාධාරය නිසා පාරිභෝගිකයන් භාණ්ඩ සඳහා ගෙවන මිල පහළ වැටෙන අතර ඒ සඳහා නිෂ්පාදකයන්ට ලැබෙන මිල ඉහළ නගී. සමතුලිත වෙළෙඳපොළක හුවමාරුවන ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් හුවමාරු වේ. මෙම වැඩි වූ නිෂ්පාදනය හා පරිභෝජනය සඳහා වෙළෙඳපොළ ලබා දෙන වටිනාකම ඒ සඳහා වැය වූ පිරිවැයට වඩා අඩු බැවින් සම්පත් භාවිතයේ අකාර්යක්ෂතාවක් හටගනී. මෙය අහිමිවන සුබසාධනයයි. (ලකුණු 01යි)

- මෙම තත්ත්වය පහත රූපසටහනෙහි දැක්වේ.




- සහනාධාරයට පෙර සමතුලිත හුවමාරුව $Q_1$ ප්‍රමාණය වූ අතර සහනාධාරයට පසු එය $Q_2$ දක්වා වැඩි විය. $Q_1$ සිට $Q_2$ දක්වා වූ අධි නිෂ්පාදනයේ සෑම ඒකකයක් සඳහා ම පාරිභෝගිකයන් ගෙවන මිලට වඩා වැඩි පිරිවැයක් එය නිෂ්පාදනය සඳහා දරන්නට සිදු වේ. මෙම නිමැවුම් ප්‍රමාණයට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අතර ඇති ABC ත්‍රිකෝණය පෙන්නුම් කරනුයේ අකාර්යක්ෂම සම්පත් භාවිතයේ ප්‍රමාණය හෙවත් අහිමි වූ සුබසාධනයයි. (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(iii) පාරිභෝගික අතිරික්තයට බලපෑම :

- සමතුලිත මිලට පහළින් උපරිම මිලක් නියම කරනු ලැබූ විට අඩු මිලට භාණ්ඩය මිල දී



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ගැනීමට පාරිභෝගිකයාට අවස්ථාව සැලැසේ. මෙය පාරිභෝගික අතිරික්තය ඉහළ යාමට හේතුවේ.

- කෙසේ වෙතත් උපරිම මිලක් නිසා සැපයුම් ප්‍රමාණය ඉක්මවා ඉල්ලුම් ප්‍රමාණය ඉහළයාමෙන් වෙළෙඳපොළේ භාණ්ඩ හිඟයක් ඇතිවිය හැකි ය. එසේ වුවහොත් ඇතැම් විට සමතුලිත මිල වුවද ගෙවීමට කැමැත්තෙන් සිටි පාරිභෝගිකයන්ට, එම භාණ්ඩය මුළුමනින් ම ලබා ගත නොහැකි තත්ත්වයට මුහුණ දීමට සිදුවිය හැකි ය. එය පාරිභෝගික අතිරික්තය පහළ හෙළීමට හේතුවේ. (ලකුණු 02යි)

නිෂ්පාදන අතිරික්තයට බලපෑම :

- සමතුලිත මිලට පහළින් උපරිම මිලක් නියම කළ විට පහත සඳහන් හේතු නිසා නිෂ්පාදක අතිරික්තය අඩු වනු ඇත.

- නිදහස් වෙළෙඳපොළක භාණ්ඩය අලෙවි කොට අයකර ගත හැකි ව තිබූ මිලට වඩා අඩු මිලකට භාණ්ඩය අලෙවි කිරීමට සිදු වීම නිසා නිෂ්පාදකයන්ගේ මුළු අයභාරයත් ලාභ ආන්තිකයත් පහළ වැටෙනු ඇත.

- උපරිම මිල යටතේ අලෙවි කිරීමෙන් ලාභදායකත්වය අඩු වීම හෝ පාඩු ලැබීම හෝ හේතුවෙන් නිෂ්පාදකයන් වෙළෙඳපොළට සපයන ප්‍රමාණය අඩු කිරීමට පෙළඹෙනු ඇත. මෙය තවදුරටත් නිෂ්පාදක අතිරික්තය අඩු කිරීමට බලපානු ඇත.

- තවදුරටත් අඩු මිලට භාණ්ඩය සැපයීම තිරසාර නොවන බැවින් ඇතැම් නිෂ්පාදකයන් මුළුමනින් ම වෙළෙඳපොළෙන් බැහැර විය හැකි ය. මේ නිසාද නිෂ්පාදක අතිරික්තය අඩු වේ. (ලකුණු 02යි)

සමස්ත ආර්ථික සුබසාධනයට බලපෑම :

- සාමාන්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ දී උපරිම මිලක් නිසා පාරිභෝගික අතිරික්තය වැඩි වීමට පිළිවන. වෙළෙඳපොළේ සමතුලිත මිලට වඩා අඩු මිලකට භාණ්ඩ මිල දී ගැනීමට අවස්ථාව ලැබෙන නිසා පාරිභෝගික අතිරික්තය වැඩි වේ. එසේ වුවද ඉල්ලුමේ දැඩි අනම්‍යතාවක් පවතී නම් පාරිභෝගික අතිරික්ත වුව ද අඩු වනු ඇත.

- සමතුලිත මිලට වඩා අඩු මිල යටතේ හුවමාරු වන භාණ්ඩ ප්‍රමාණය සංකෝචනය වීම නිසා නිෂ්පාදක අතිරික්තය අවශ්‍යයෙන් ම පහළ වැටෙනු ඇත.

- උපරිම මිලක් යටතේ වෙළෙඳපොළ සමතුලිත තත්ත්වයට පත්නොවන අතර සැපයුම් ප්‍රමාණයට වඩා ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යනු ඇත. මේ මගින් සම්පත් භාවිතය අකාර්යක්ෂම වී අහිමි වූ සුබසාධනයක් හටගනී.

- උපරිම මිලක් යටතේ සාමාන්‍යයෙන් වෙළෙඳපොළෙහි භාණ්ඩ හිඟයක් බිහිවන අතර මේ තත්ත්වය සුබසාධනය අහිමිකිරීමක් ඇතිකරනවා පමණක් නොව මිල නොවන සලකන ක්‍රම ඔස්සේ භාණ්ඩය ලබා ගැනීමට කටයුතු කිරීමේ දී (පෝලිම්, කළුකඩ හටගැනීම) සමස්ත සුබසාධනය තවදුරටත් අඩු විය හැකි ය. (ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**4.** (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිත සන්දර්භය තුළ හීනවන ආන්තික ඵලදා නීතිය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ii) කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී ආයතනයක් ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම තීරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 03යි)

(iii) නිෂ්පාදන කාල පරිච්ඡේදයක් තුළ, ආයතනයක් රු. 200 000ක මුළු අයභාරයක් උපයාගන්නා අතර, රු. 150 000ක ප්‍රත්‍යක්ෂ වියදම (ඍජු පිරිවැය) ක් දරයි. ආයතන හිමිකරුගේ ප්‍රාග්ධනයේ සහ ශ්‍රමයේ ආවස්ථික පිරිවැය ඇතුළු ව ආරෝපිත පිරිවැය රු. 70 000කි.
ආයතනයේ ගණකාධිකාරී ලාභය සහ ආර්ථික ලාභය ගණනය කරන්න. (ලකුණු 04යි)

(iv) අමුද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාමක් වැනි කරුණක් මත ආයතනයේ පිරිවැය ව්‍යුහයේ ඉහළ යාමක්, ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රයට සහ සමස්ත කර්මාන්තයේ සැපයුම් වක්‍රයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. ඔබගේ පැහැදිලි කිරීම සඳහා සුදුසු රූපසටහන් යොදා ගන්න. (ලකුණු 05යි)

(v) පූර්ණ තරගකාරී ආයතනයක් තම නිමැවුම ඒකකයක් රු. 120ක් වූ වෙළෙඳපොළ මිලක් යටතේ අලෙවි කරයි. ඒකක 60ක් නිෂ්පාදනය කරන විට ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 80ක් වන අතර සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු. 20කි.

(අ) මෙම නිමැවුම් මට්ටමේ දී ආයතනයේ මුළු අයභාරය, මුළු පිරිවැය සහ ආර්ථික ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 04යි)

(ආ) එම නිමැවුම් මට්ටමේ දී නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 02යි)

04.(i) - හීනවන ආන්තික ඵලදායිතා නීතිය යනුවෙන් අදහස් කරනුයේ කෙටි කාලයේ දී අනික් සියලු කරුණු නොවෙනස් ව තිබිය දී, විචල්‍ය සාධකයක (ශ්‍රමය වැනි) අතිරේක ඒකක ස්ථාවර යෙදවුමක් (ප්‍රාග්ධනය හෝ භූමිය වැනි) සමඟ මිශ්‍ර කොට නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගන්නා විට එක් එක් අතිරේක විචල්‍ය යෙදවුම් ඒකකයන්ගේ ආන්තික නිෂ්පාදිතය එක්තරා අවස්ථාවකට පසුව පහළ බසින බව ය. (ලකුණු 02යි)

(මුළු ලකුණු 02යි)

(ii) ආයතනයක් කෙටි කාලයේ දී ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම තීරණය කරන ආකාරය :

- ආන්තික අයභාරය (MR) = ආන්තික පිරිවැය (MC) ප්‍රවේශය :
කෙටි කාලයේ දී ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම තීරණය කරනුයේ අදාළ නිමැවුම් මට්ටමේ දී ආන්තික අයභාරය (MR) එම නිමැවුම් මට්ටමේ ආන්තික පිරිවැය (MC) ට සමාන විය යුතු ය යන කොන්දේසිය මත ය. (ලකුණු 01යි)

- ආන්තික අයභාරය යනු අතිරේක නිමැවුම් ඒකකයක් අලෙවි කිරීමෙන් ආයතනය උපයන අතිරේක අයභාරයයි. ආන්තික පිරිවැය යනු අතිරේක ඒකකයක් නිෂ්පාදනය කිරීමේ දී හටගන්නා අතිරේක පිරිවැයයි. ආන්තික අයභාරය, ආන්තික පිරිවැය ඉක්මවා යන විට ලාභය වැඩි වන බැවින් ආයතනය නිෂ්පාදනය ප්‍රසාරණය කරයි. ආන්තික පිරිවැයට වඩා ආන්තික අයභාරය අඩු වන විට ලාභ අඩු වන බැවින් නිෂ්පාදනය සංකෝචනය කරයි. එමනිසා ප්‍රශස්ත නිමැවුම් මට්ටම වන්නේ ආන්තික අයභාරය (MR) ආන්තික පිරිවැය (MC) එකිනෙකට සමාන කෙරෙන නිමැවුම් මට්ටමයි. එහිදී මුළු ලාභය උපරිම වන අතර ලාභයට තවත් එකතුවීමක් හෝ අඩුවීමක් හෝ සිදු නොවේ. (ලකුණු 01යි)

- ලාභ උපරිම කරන නිමැවුම් මට්ටමේ දී MC ඉහළ යමින් තිබිය යුතු ය. ලාභ උපරිමනය සඳහා MR = MC කොන්දේසිය ප්‍රමාණවත් නොවේ. ලාභ උපරිම කරන නිමැවුම් මට්ටමේ සිට නිමැවුම තවත් ඒකකයකින් වැඩි කරනු ලැබුවහොත් අතිරේක ඒකකය නිසා අයභාරයට වඩා වේගයෙන් පිරිවැය ඉහළ යන බැවින් ලාභ අඩුවනු ඇත. (ලකුණු 01යි)

(මුළු ලකුණු 03යි)




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

නැතහොත්

- මුළු අයභාරය සහ මුළු පිරිවැය අතර වෙනස අනුව ලාභ උපරිමනය තීරණය කිරීමේ ප්‍රවේශයඃ
- ලාභය ගණනය කරනුයේ මුළු අයභාරයෙන් මුළු පිරිවැය අඩු කළ විට ලැබෙන ශේෂය මත ය. ඒ අනුව විවිධ නිමැවුම් මට්ටම්වල දී ආයතනයේ මුළු අයභාරය හා මුළු පිරිවැය අතර වෙනස ගණනය කොට වැඩි ම ධනාත්මක ශේෂය ඇති නිමැවුම් මට්ටම ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම් ලෙස තෝරා ගනු ලැබේ. **(ලකුණු 03යි)**

නැතහොත්

- ප්‍රස්තාරිකවද කෙටි කාලීන ලාභ උපරිමනය කරන ආකාරය තීරණය කළ හැකි ය.
- කෙටි කාලයේ දී ආයතනයේ මුළු අයභාරය හා මුළු පිරිවැය හැසිරෙන ආකාරය පෙන්නුම් කරන ප්‍රස්තාර සටහනක් උපයෝගී කර ගනිමින් මුළු පිරිවැය ඉක්මවා මුළු අයභාරය ඉහළ යන වැඩි ම ප්‍රමාණයට අදාළ නිමැවුම් මට්ටම සොයා ගත හැකි ය.





ඉහත රූපසටහනෙහි පෙන්නුම් කරන ආකාරයට TR වක්‍රය සහ TC වක්‍රය අතර සිරස් දුර ආර්ථික ලාභය පෙන්නුම් කරයි. ඒ අනුව Q* නිමැවුම් ප්‍රමාණයේ දී වැඩි ම සිරස් දුර වන CB වන අතර එම නිමැවුම ලාභ උපරිම කරන නිමැවුම වේ.

එම ලාභ උපරිමන ලක්ෂ්‍යයේ දී මුළු අයභාර වක්‍රයේ බෑවුම එනම් (MR) මුළු පිරිවැය වක්‍රයේ බෑවුම (MC) ට සමාන වේ. එනම් ලාභය උපරිම වන විට MR = MC කොන්දේසිය ද ඉෂ්ට වේ. **(ලකුණු 03යි)**

නැතහොත්

- ආන්තික ප්‍රවේශය ඔස්සේ ද ආන්තික අයභාර වක්‍රය සහ ආන්තික පිරිවැය වක්‍රය අධ්‍යයනය කොට ලාභ උපරිම වන නිමැවුම් මට්ටම ප්‍රස්තාරිකව තීරණය කළ හැකි ය.






Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

නිමැවුම වැඩි කරන විට ආන්තික අයභාරය නොවෙනස් ව තිබුණ ද ආන්තික පිරිවැය වෙනස් වේ. ආන්තික පිරිවැය ඉක්මවා ආන්තික අයභාරය පවතී නම් (එනම් MR > MC) අතිරේක ඒකකයක් අලෙවි කිරීමෙන් ලැබෙන අතිරේක ආදායම එය නිපදවීම සඳහා දරන අතිරේක පිරිවැයට වඩා වැඩි ය. ආයතනය එම ආන්තික ඒකකයෙන් ආර්ථික ලාභයක් උපයයි. ඒ අනුව නිමැවුම ප්‍රසාරණය කරන විට ආර්ථික ලාභ වැඩි වේ. අනික් අතට ආන්තික පිරිවැය ආන්තික අයභාරයට වඩා වැඩි නම් අතිරේක ඒකකය නිපදවීමට යොදාගත් පිරිවැයට වඩා ආන්තික අයභාරය අඩු ය. මෙහි දී ආර්ථික අලාභයක් හට ගනී. එම තත්ත්වය යටතේ නිමැවුම ප්‍රසාරණය කරන විට ආර්ථික ලාභ අඩු වන්නට පටන් ගනී. ආන්තික අයභාරය හා ආන්තික පිරිවැය එකිනෙකට සමාන වන (MR = MC) නිමැවුම් මට්ටමේ දී ලාභ උපරිම වේ. රූපසටහනෙහි Q* නිමැවුම් ප්‍රමාණයේ දී MR = MC වන අතර එම නිමැවුම ලාභ උපරිම කරන නිමැවුම් මට්ටම වේ.

(ලකුණු 03යි)
(මුළු ලකුණු 03යි)

(iii) - ගණකාධිකාරී ලාභය = මුළු අයභාරය - සෘජු පිරිවැය (ලකුණු 01යි)
= 200,000 - 150,000
= රු. 50,000 (ලකුණු 01යි)

- ආර්ථික ලාභය = මුළු අයභාරය - (සෘජු පිරිවැය + ආරෝපිත පිරිවැය) (ලකුණු 01යි)
= 200,000 - (150,000 + 70,000)
= 200,000 - 220,000
= රු. -20,000 (ආර්ථික අලාභයකි.) (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)


(iv) - ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රයට බලපෑම :

- අමුද්‍රව්‍ය පිරිවැය කෙටි කාලීන විචල්‍ය පිරිවැයෙහි ප්‍රධාන සංරචකයකි. එබැවින් අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යන විට ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය සහ එයට අනුරූප ආන්තික පිරිවැය ද ඉහළ යයි. ආයතනයේ සැපයුම් වක්‍රය පෙන්නුම් කරනුයේ විකල්ප මිලයන් යටතේ ආයතනය සැපයීමට කැමැති විවිධ ප්‍රමාණයන් ය.

- අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා සෑම නිමැවුම් මට්ටමකට ම අදාළ සාමාන්‍ය විචල්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය ඉහළ යනු ඇත. අමුද්‍රව්‍ය මිල ඉහළ යාමට පෙර එක් එක් මිලේ දී ආයතනය සැපයීමට සූදානම් ව සිටි ප්‍රමාණ දැන් සැපයීමට නොහැකි වනු ඇත. එක් එක් ප්‍රමාණ සඳහා පෙරට වඩා වැඩි මිලක් ආයතනය අපේක්ෂා කරයි. මෙහි ප්‍රතිඵලය වන්නේ ආයතනය සාමාන්‍ය විචල්‍ය සහ ආන්තික පිරිවැය වක්‍ර ඉහළට හෙවත් වමට විතැන් වීම ය. ආයතනයේ සැපයුම් වක්‍රය ලෙස සැලකෙන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රයයි. දැන් එය ඉහළට විතැන් වී ඇත. අළුත් සැපයුම් වක්‍රයට අනුව කලින් සැපයූ භාණ්ඩ ප්‍රමාණය සඳහා පෙරට වඩා ඉහළ මිලක් ආයතනය අපේක්ෂා කරයි. (රූපසටහනෙහි $MC^2$ වක්‍රය)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/




කර්මාන්තයේ සැපයුම් වක්‍රයට බලපෑම :
කර්මාන්තයේ සැපයුම් වක්‍රය යනුවෙන් අදහස් කරනුයේ සියලු ම ආයතනවල සැපයුම් වක්‍ර තිරස් අතට එකතු කොට ලබා ගන්නා සැපයුම් වක්‍රයයි. අමුද්‍රව්‍යවල මිල ඉහළ යාම කර්මාන්තයේ සිටින සියලු ම ආයතනවලට බලපාන්නේ නම් සියලු ම ආයතනවල සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍ර සහ ආන්තික පිරිවැය වක්‍ර ඉහළට විතැන් වනු ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත කර්මාන්තයේ ම සැපයුම් වක්‍රය වමට විතැන් වනු ඇත. සෑම ආයතනයක් ම එක් එක් මිලේ දී පෙර දී සැපයූ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් අමුද්‍රව්‍ය මිල ඉහළ ගිය පසු සපයනු ලැබේ. (රූපසටහනෙහි $S_2$ වක්‍රය) (ලකුණු 01යි)

(මුළු ලකුණු 02යි)

(v) (අ)- ආයතනයේ මුළු අයභාරය (TR) :

- මුළු අයභාරය (TR) = ඒකකයක මිල x නිමැවුම් ප්‍රමාණය

  TR = 120 x 60

  = රු. 7200 (ලකුණු 01යි)

- මුළු පිරිවැය (TC) = ස්ථාවර පිරිවැය (TFC) + මුළු විචල්‍ය පිරිවැය (TVC)

  = 1200 + 4800

  = රු. 6000 (ලකුණු 01යි)

- ආර්ථික ලාභය/ අලාභය :

  ලාභය/ අලාභය = මුළු අයභාරය (TR) - මුළු පිරිවැය (TC)

  = 7200 - 600

  ලාභය = රු. 1200 (ලකුණු 02යි)

(ආ) නිෂ්පාදක අතිරික්තය = මුළු අයභාරය - මුළු විචල්‍ය පිරිවැය (ලකුණු 01යි)

මුළු අයභාරය (TR) = 7200

මුළු විචල්‍ය පිරිවැය = 80 x 60

= 4800

නිෂ්පාදක අතිරික්තය = 7200 - 4800

= රු. 7400 (ලකුණු 01යි)

(මුළු ලකුණු 06යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

5. (i) විවෘත ආර්ථිකයක චක්‍රීය ආදායම් ප්‍රවාහ ආකෘතිය තුළ ඇතුළත් කාන්දුවීම් නම් කරන්න. (ලකුණු 03යි)

(ii) ජාතික ගිණුම්කරණ පද්ධතිය තුළ නිෂ්පාදන ඉමෙන් බැහැර කරනු ලබන්නේ කවර ක්‍රියාකාරකම් ද? (ලකුණු 03යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද නැතහොත් අසත්‍ය ද යන්න සඳහන් කොට ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(අ) යැපුම් ගොවිතැන වැනි තමන්ගේ ම පරිභෝජනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරගැනීම නිෂ්පාදන ඉමට ඇතුළත් කෙරේ.

(ආ) ජාතික ගිණුම්කරණ පද්ධතිය තුළ 'අවශේෂ ලෝකය' ආයතනික ඒකකයක් ලෙස සැලැකේ.

(ඉ) ව්‍යාපාරික ආයතන විසින් ගෙවනු ලබන වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු, 'නිෂ්පාදනය මත වෙනත් බදුවල' කොටසක් වේ.

(ඊ) මුදල් හුවමාරු කරගැනීමක් සිදු නොවන බැවින් භාණ්ඩ හුවමාරු ගනුදෙනු (barter transactions) නිෂ්පාදන ඉමට ඇතුළත් නො කෙරේ.

(උ) 'නිෂ්පාදිතය මත බදු' අදාළ වන්නේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය මත සෘජුව ම පනවනු ලබන බදුවලට පමණි.

(01 × 5 = ලකුණු 05යි)

(iv) ස්වායත්ත පරිභෝජනය රු. බිලියන 200ක් ද ආන්තික පරිභෝජන නැමියාව වැය කළ හැකි ආදායමෙන් 80%ක් ද ආයෝජනය රු. බිලියන 500ක් ද සහිත සංවෘත ආර්ථිකයක් සැලකිල්ලට ගන්න. තව ද රජයේ වියදම රු. බිලියන 300ක් ද ස්වායත්ත බදු රු. බිලියන 200ක් ද වේ.

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 04යි)

(v) (අ) 'ප්‍රතිගමනාත්මක පරතරය' නිර්වචනය කොට එය සමාහාර ඉල්ලුම්-සැපයුම් ආකෘතියක පෙන්නුම් කරන්න. (ලකුණු 03යි)

(ආ) ප්‍රතිගමනාත්මක පරතරය ඉවත් කොට ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටම කරා ගෙන ඒමට ඔබ යෝජනා කරන ප්‍රතිපත්ති නිර්දේශ කවරේ ද? (ලකුණු 02යි)

05.(i) - ඉතුරුම් (S)

- බදු (T)
- ආනයන (M)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)

(මුළු ලකුණු 03යි)

(ii) නිෂ්පාදන ඉමෙන් බැහැර කෙරෙන ක්‍රියාකාරකම් :

- ගෙවීමකින් තොරව නිවස තුළ ඉටු කරනු ලබන ගෘහ සේවා : නිවස පිරිසිදු කිරීම, අලංකාර කිරීම, නඩත්තු කිරීම, ආහාර පිළියෙල කිරීම, දරුවන් රැක බලා ගැනීම, පුහුණු කිරීම, පවුලේ වියපත් සාමාජිකයන්, ආබාධිත අය, රෝගී අය රැක බලා ගැනීම, නිවැසියන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම.

- ස්වේච්ඡා සේවා : ගෙවීමක් නොලබා වෙළෙඳපොළ නොවන ආයතනවලට (පුණ්‍යායතන) සහ කුටුම්බවලට ලබා දෙන ස්වේච්ඡා සේවා

- සංක්‍රාම ගෙවීම් : විශ්‍රාම වැටුප්, විරැකියා ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණය වශයෙන් රජය විසින් ලබා දෙන සංක්‍රාම ගෙවීම්

- ශුද්ධ වශයෙන් මූල්‍යමය ස්වරූපයක් ගන්නා ගනුදෙනු : කොටස්, බැඳුම්කර වැනි මූල්‍යමය වත්කම් විකිණීම සහ මිල දී ගැනීම.

- ප්‍රාග්ධන භාණ්ඩ සහ පරිභෝජන භාණ්ඩ වල හිමිකාරිත්වය පැවරීම

- අවසාන භාණ්ඩයක් වශයෙන් වරක් මිලට ගත් පරිභෝජන භාණ්ඩයක් හෝ ප්‍රාග්ධන භාණ්ඩයක් හෝ නැවත විකිණීම.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- මිනිස් මැදිහත්වීමකින් තොරව ස්වාභාවිකව සිදුවන ස්වාභාවික ක්‍රියාකාරකම්
  (නිදසුන් : සාගරයන්හි මත්ස්‍ය ජනනය වීම, වනාන්තර වර්ධනය වීම.)

(එක් ක්‍රියාකාරකමකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)

(මුළු ලකුණු 03යි)

(iii) (අ)- සත්‍ය වේ.

- යැපුම් ගොවිතැන වෙළෙඳපොළ වටිනාකමක් සහිත භාණ්ඩ (අලෙවි නොකොට තමන්ගේ ම පරිභෝජනයට ගනු ලැබුවද) බිහි කෙරෙන ඵලදායි ආර්ථික ක්‍රියාකාරකමකි. නිමැවුමේ වටිනාකම මුදලින් මැනිය හැකි ය.

(ආ)- සත්‍ය වේ.

- අදාළ රටෙහි නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර සිදුවන සියලු ම ආර්ථික ගනුදෙනු වාර්තා කරනුයේ මෙම ආයතනික ඒකකයි. විදේශ වෙළෙඳාම, විදේශ ආයෝජන, රට තුලට ගලා එන සහ පිටතට යන ආදායම් ප්‍රවාහ සියල්ල ම මීට ඇතුළත් වේ. විවෘත ආර්ථිකය ගෙවුම් ශේෂය සැකසීමට දළ ජාතික ආදායම තීරණය කිරීමට මෙම ගනුදෙනු ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

(ඉ) - සත්‍ය වේ.

- ව්‍යාපාරික ආයතන විසින් ගෙවනු ලබන වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු, 'නිෂ්පාදනය මත වෙනත් බදු' යටතට ඇතුළත් වේ. මක්නිසාදයත් ඒවා නිෂ්පාදිතයක් පදනම් කරගත් විශේෂිත බද්දක් හෝ වටිනාකම් හෝ නොවන බැවිනි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී මේ බදු ගෙවීමට සිදු වන අතර ඒවා නිමැවුම සමඟ සෘජු සම්බන්ධයක් නොදක්වයි.

(ඊ) - අසත්‍ය වේ.

- මුදල් හුවමාරුවක් නොවුවද භාණ්ඩ හුවමාරු ගනුදෙනු ජාතික ගිණුම්කරණයේ දී නිෂ්පාදන ඉමට ඇතුළත් වේ. මුදල් ගනුදෙනුවක් සිදුවත් නැතත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයක් හට ගැනීමට අදාළ සියලු ආර්ථික ක්‍රියාකාරකම් නිෂ්පාදන ඉමට ඇතුළත් වේ.

(උ) - අසත්‍ය වේ.

- 'නිෂ්පාදිතය මත බදු' හුදෙක් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය මත සෘජුව ම පනවනු ලබන බදුවලට පමණක් සීමා නොවේ. නිෂ්පාදන/ සුරා බදු, අලෙවි බදු, එකතු කළ අගය මත බදු වශයෙන් විවිධ ස්වරූපයේ නිෂ්පාදිතය මත බදු දක්නට ලැබේ. එම බදු හුදෙක් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය පමණක් නොව, ඒවායේ මිල වටිනාකම සහ වෙනත් ගුණාංග වැනි කරුණු පදනම් කර ගෙන පනවනු ලැබේ. (1 × 5 = ලකුණු 05යි)

(මුළු ලකුණු 05යි)

(iv) සමතුලිත ජාතික ආදායම් මට්ටම :

- $Y = C+I+G$ (ලකුණු 01යි)
- $C = C_0+MPC \times (Yd)$ (ලකුණු 01යි)
- $Y = 200+0.8(Y-T)+500+300$ (ලකුණු 01යි)
- $Y = 200+0.8(Y-200)+500-300$ (ලකුණු 01යි)
- $Y = 200+0.8Y-160-500+300$

$Y = 0.8Y+1000+160$

$Y = 4200$

රු.බිලියන 4200 (ලකුණු 01යි)


(මුළු ලකුණු 04යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v)(අ) - 'ප්‍රතිගමනාත්මක පරතරය' යනු ආර්ථිකයේ සැබෑ නිමැවුම් මට්ටම, එහි විභව නිමැවුම් මට්ටමට හෙවත් පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමට වඩා අඩුවෙන් පවතින විට විභව නිමැවුම සහ සැබෑ නිමැවුම අතර වෙනස ය. (ලකුණු 02යි)

- 'ප්‍රතිගමනාත්මක පරතරය' පහත දැක්වෙන ආකාරයට සමාහාර ඉල්ලුම් - සැපයුම් ආකෘතියක පෙන්නුම් කළ හැකි ය.




(ලකුණු 01යි)

(ආ)- ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති
- ආණ්ඩුවේ මිල දී ගැනීම් වැඩි කිරීම
- බදු කපා හැරීම.
- සමාජ සුබසාධන වැඩසටහන් පුළුල් කිරීම.

- ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති
  - පොලී අනුපාතික පහළ හෙළීම.
  - ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් (Quantitative Easing) - මූල්‍ය ප්‍රසාරණය

- ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිපත්ති
  - ව්‍යුහාත්මක සේවා වියුක්තිය අඩු කිරීම සඳහා පුහුණු කිරීම් සහ අධ්‍යාපන වැඩසටහන්
  - වැටුප් හා සේවා නියුක්ති සහනාධාර, ශ්‍රම වෙළෙඳපොළ දෘඪතා අඩු කිරීම.

- පෞද්ගලික ආයෝජනය දිරිමත් කිරීම.
  - ආයෝජනය සඳහා බදු භාණ්ඩ මිල
  - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ආධාර කිරීම.
  - නව්‍යතා සහ ව්‍යවසායකත්වයන් උත්තේජනය

- වෙළෙඳ හා අපනයන ප්‍රතිපත්ති
  - අපනයන ප්‍රවර්ධනය
  - වෙළෙඳ බාධක ඉවත් කිරීම.

- උද්ධමනය පාලනය කිරීම.

- ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ
  - ඵලදායිතා ඉහළ නැංවීම. (තාක්ෂණය)
  - ඩිජිටල් යටිතල පහසුකම් ප්‍රවර්ධනය
  - නියාමන ප්‍රතිසංස්කරණ (ව්‍යාපාර කර ගෙන යාමේ පහසුව ඇති කිරීම.)

(එක් ප්‍රතිපත්තියකට ලකුණු 01 බැගින් ඕනෑම ප්‍රතිපත්ති දෙකකට ලකුණු 02යි)

(මුළු ලකුණු 05යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**'ආ' උප කොටස**

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

**6. (i) ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති සන්දර්භය තුළ බහුල ව භාවිත කෙරෙන මුදල් සමස්ත (money aggregates) තුන නම් කරන්න. (ලකුණු 03යි)**

**(ii) ශ්‍රී ලංකාවේ උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ වාර්තා වූ 70%ක පමණ ඉහළ මට්ටම්වල සිට 2023 වර්ෂයේ අවසානයෙන් පසු තනි ඉලක්කමක මට්ටමෙහි තබා ගැනීමට දායක වී ඇති සාධක මොනවා ද? (ලකුණු 04යි)**

**(iii) මූල්‍ය ප්‍රතිපත්ති සැකසීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන් මතුපිට උද්ධමනයට වඩා මූලික උද්ධමනය කෙරෙහි අවධානය යොමු කරනුයේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)**

**(iv) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ ඉහළ යාමක් මුදල් සැපයුම සහ බැංකු පද්ධතියේ මුදල් මැවීමේ හැකියාව මත ඇති කරන බලපෑම කුමක් වන්නේ ද? (ලකුණු 04යි)**

**(v) පොලී අනුපාතික කොරිඩෝව පිළිබඳ සංකල්පය පැහැදිලි කර ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය තුළ එහි කාර්යභාරය විග්‍රහ කරන්න. (ලකුණු 05යි)**

06.(i) ශ්‍රී ලංකාවේ බහුලව භාවිත කෙරෙන මුදල් සමස්ත:
- සංචිත මුදල් ($M_0$)
- පටු මුදල් ($M_1$)
- ඒකාබද්ධ පුළුල් මුදල් ($M_{2b}$)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)
(මුළු ලකුණු 03යි)

(ii) උද්ධමනය තනි ඉලක්කමක මට්ටමෙහි තබා ගැනීමට දායක වී ඇති කරුණු :
- දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය : ශ්‍රී ලංකා මහ බැංකුව පොලී අනුපාතික ඉහළ නැංවීම් මාලාවක් ක්‍රියාත්මක කළ අතර දැඩි මූල්‍ය ස්ථාවරත්වයක් පවත්වා ගෙන ගියේ ය.

- විනිමය අනුපාතිකය ස්ථාවර කිරීම : 2022 දී තියුණු ලෙස ක්ෂයවීම අත්විඳීමෙන් පසු ආනයන සීමා කිරීම් සහ ගෙවුම් ශේෂය වැඩි දියුණු කර ගැනීම් මගින් ශ්‍රී ලංකා රුපියල ස්ථාවර විය. මේ මගින් ආනයනික උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමට හැකි විය.

- රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කර ගැනීම : ශ්‍රී ලංකා රජය අයවැය හිඟය අඩු කිරීම, ආදායම් එකතු කිරීම ඉහළ නැංවීම ඇතුළු ක්‍රියාමාර්ග ඔස්සේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව (fiscal consolidation) ඇතිකර ගත්තේ ය. 2023 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ EFF වැඩසටහන ක්‍රියාවට නැංවීම උද්ධමන පීඩනය මැඩ පැවැත්වීම සඳහා මූල්‍ය අසමතුලිතතාව අඩු කිරීමට උපකාර විය.

- සැපයුම්දාම සාමාන්‍යකරණය කර ගැනීම : කොවිඩ් - 19 වසංගතය සහ රුසියානු - යුක්‍රේන යුද්ධය නිසා ඇති වූ බාධාවන්ගෙන් මිදී ගෝලීය සැපයුම්දාම යථා තත්ත්වයට පත් වීමත් සමඟ ආහාර හා ඉන්ධන ඇතුළු ආනයනික භාණ්ඩවල පිරිවැය ස්ථාවරවීමට පටන් ගත්තේ ය.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ගෝලීය භාණ්ඩ මිල අඩු වීම : 2023 මැද භාගයේ සිට ගෝලීය බණිජ තෙල් සහ ආහාර මිල ගණන් මධ්‍යස්ත මට්ටමක පැවැතීම ශ්‍රී ලංකාවේ පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය පාලනය කර ගැනීමට බෙහෙවින් දායක වීම.

- ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම : ණය ප්‍රතිව්‍යුහගත කිරීම, යහපත් ආණ්ඩුකරණය ඇතුළුව රටේ සාර්ව ආර්ථික ස්ථායිතාව ශක්තිමත් කිරීම අරමුණු කරගත් ප්‍රතිසංස්කරණ ආයෝජකයන්ගේ විශ්වාසය සහ ආර්ථික ස්ථායිතාව යථා තත්ත්වයට පත් කිරීමට උපකාර විය. මේ මගින් රටේ උද්ධමන අපේක්ෂා පාලනය විය.

- විදේශ මූල්‍ය සහාය : ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අනෙකුත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන මූල්‍ය ආධාර ලබා දුන් අතර එය ආර්ථිකය සහ විනිමය අනුපාතික ස්ථාවර කර ගැනීමට උපකාරී විය.

**(එක් ප්‍රතිපත්තියකට ලකුණු 01 බැගින් ප්‍රතිපත්ති හතරකට ලකුණු 04යි)**

(iii) - ප්‍රතිපත්ති සම්පාදකයන් මූල්‍ය ප්‍රතිපත්ති සැකසීමේ දී මූලික උද්ධමනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනුයේ උද්ධමනීය ප්‍රවණතා පිළිබඳ වඩා ස්ථාවර හා විශ්වාසනීය මිනුමක් එය ලබා දෙන බැවිනි. මූලික උද්ධමනය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ආර්ථිකයේ දිගුකාලීන උද්ධමන පීඩන හඳුනා ගෙන වඩා හොඳ දැනුවත් තීරණ ගත හැකි ය.

- මූලික උද්ධමනය තාවකාලික අස්ථාවරත්වයන් බැහැර කරයි. මතුපිට උද්ධමනයට සෘතුමය බලපෑම්, ගෝලීය සැපයුම් කම්පන, කාලගුණික තත්ත්වයන් වැනි සාධක හේතුවෙන් කෙටි කාලීන අස්ථාවරත්වයට පත්වන ආහාර, බලශක්ති ඇතුලු පාරිභෝගික මිල දර්ශකයේ සියලු ම අයිතම ඇතුළත් වේ.
අනික් අතට මූලික උද්ධමනය ගණනය කිරීමේ දී මෙවැනි චංචලකාරී අයිතම ඉවත් කෙරේ. එවිට එය ආර්ථිකයේ යටින් දිවෙන වඩාත් ස්ථිර සාර උද්ධමනීය ප්‍රවණතා පිළිබඳ පිළිබිඹුවක් සපයයි. ඒ අනුව තාවකාලික මිල චලනයන්ට ප්‍රතික්‍රියා දැක්වීමෙන් වැළැකී සිටීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට මෙය මඟ පෙන්වයි.

- දිගු කාලීන උද්ධමන ප්‍රවණතා පිළිබඳ වඩා හොඳ දර්ශකයක් වීම : චංචලතාවය අඩු සංරචක කෙරෙහි අවධානය යොමු කිරීමෙන් එය ඉල්ලුම් පාර්ශ්වීය සාධකවලින් පැන නගින දිගු කාලීන උද්ධමන පීඩනය පිළිබඳ ව පැහැදිලි චිත්‍රයක් ලබා දෙයි. මතුපිට උද්ධමනය මිල කම්පන කෙරෙහි දැඩි සංවේදීතාවක් දක්වන බැවින් සැබෑ උද්ධමනකාරී පරිසරය පිළිබඳ නොමග යවන සුළු සංඥා ලබා දීමට පිළිවන.

- අනවශ්‍ය ප්‍රතිපත්ති ගැළපුම් ඇති කිරීම මේ මගින් වැළැකේ : තෙල් මිල ඉහළ යෑම හෝ ස්වාභාවික විපත් වැනි සාධක නිසා මතුපිට උද්ධමනයේ හටගන්නා තාවකාලික වැඩිවීම් කෙරෙහි මූල්‍ය ප්‍රතිපත්තිය ප්‍රතිචාර දැක්වීමට තැත්කිරීමෙන් ආර්ථිකට අනවශ්‍ය බාධා කිරීම් සහ අර්බුද පැන නැගිය හැකි ය. මූලික උද්ධමනය කෙරෙහි අවධානය යොමු කොට ප්‍රතිපත්ති තීරණ ගැනීමෙන් එවැනි තත්ත්වයන් වළක්වා ගත හැකි ය.

- උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීමට වඩාත් අදාළ වේ : මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණක් වන්නේ උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීම ය. මූලික උද්ධමනය කාලයත් සමඟ පවතින උද්ධමනීය ප්‍රවණතා මැනවින් නියෝජනය කරන අතර උද්ධමන අපේක්ෂාවන් බොහෝ විට පදනම් කරනුයේ එම ප්‍රවණතාවන් ය.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- සැපයුම් පාර්ශ්වීය කම්පන පාලනය කිරීමෙහිලා මූල්‍ය ප්‍රතිපත්තියට හැකියාවන් අඩු ය. : ගෝලීය ඛණිජ තෙල් මිල ඉහළ යාම හෝ කෘෂි කාර්මික අංශයේ පසුබෑම් වැනි සැපයුම් පාර්ශ්වීය කම්පනයන් නිසා මතුපිට උද්ධමනය බලපෑමට ලක්වේ. එහෙත් සැපයුම් පාර්ශ්වීය උද්ධමන පාලනය කිරීමේලා මූල්‍ය ප්‍රතිපත්තියට ඇති හැකියාව අතිශයින් සීමිත ය. මූල්‍ය ප්‍රතිපත්තියට බලපෑමක් කළ හැක්කේ පරිභෝජනය, ආයෝජනය, පොලී අනුපාතික වැනි සමාහාර ඉල්ලුම හා සම්බන්ධ විචල්‍යයන් කෙරෙහි පමණි. එබැවින් මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවිය යුතු සීමාව හඳුනා ගැනීමට මූලික උද්ධමනයේ ප්‍රමාණය ප්‍රතිපත්ති සම්පාදකයන්ට අතිශයින් වැදගත් වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)

(මුළු ලකුණු 04යි)

(iv) - මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩිකරන විට තම තැන්පතුවලින් පෙරට වඩා වැඩි ප්‍රතිශතයක් සංචිත වශයෙන් තබා ගැනීමට වාණිජ බැංකුවලට සිදුවේ. එම සංචිත යොදා ගනිමින් අළුතින් ණය ලබාදීමටත් එමගින් අළුත් තැන්පතු ඇති කර ගැනීමටත් ඇති හැකියාව සීමා වේ. ආර්ථිකයේ මුදල් සැපයුම අඩුවීමට මෙය කීප ආකාරයකින් බලපායි.

(ලකුණු 01යි)

- වාණිජ බැංකුවල ණයදීමේ හැකියාව (ධාරිතාව) අඩු වේ : ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ දැමූ විට බැංකුවලට ණය ලබාදීමට ඇති අධි සංචිත ප්‍රමාණය අඩු වේ. මුදල් සැපයුම ඉහළ යාමට බලපාන ප්‍රධාන සාධකයන් වන්නේ ණය ලබාදීම ය. දැන් ණය ලබාදීමේ හැකියාව අඩුවන බැවින් මුදල් සැපයුම ප්‍රසාරණය වීමට ඇති ඉඩ කඩ සීමාසහිත වනු ඇත.

(ලකුණු 01යි)

- මුදල් මැවීමේ හැකියාව අඩු වේ : මුදල් ප්‍රසාරණය සංගුණකයේ බලපෑම සීමා වනු ඇත. මුදල් ගුණකය යනු බැංකු පද්ධතියට එක් සංචිත ඒකකයකින් මැවිය හැකි මුදල් ඒකක ප්‍රමාණයයි. සංචිත අනුපාතය ඉහළ දැමූ විට ගුණකයේ අගය අඩු වේ. එක් සංචිත මුදල් ඒකකයකින් මැවිය හැක්කේ පෙරට වඩා අඩු මුදල් ප්‍රමාණයයි. (ලකුණු 01යි)

- මුදල් ප්‍රසාරණ සංගුණකය පහත ආකාරයට දැක්විය හැකි ය.

$$\frac{1}{SRR}$$

මේ අනුව මුදල් ප්‍රසාරණ සංගුණකය සංචිත අනුපාතයේ පරස්පරයයි. සංචිත අනුපාතය ඉහළ අගයක් ගන්නා විට මුදල් ගුණකය අඩු අගයක් ගනී. මින් අදහස් වන්නේ සෑම අතිරේක සංචිත ඒකකයකින්ම මැවිය හැකි මුදල් ප්‍රමාණය අඩු වන බව ය. මේ අනුව සමස්තයක් වශයෙන් මුදල් සැපයුම සංකෝචනය වේ.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(v) - පොලී අනුපාතික කොරිඩෝව යනු කෙටි කාලීන පොලී අනුපාතිකවලට බලපෑම් කිරීමට සහ සමස්ත මූල්‍ය ප්‍රතිපත්තියේ යොමුව සම්බන්ධයෙන් මගපෙන්වීමක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිත කරන ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති මෙවලමකි.

- නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යන ප්‍රතිපත්ති පොලී අනුපාතික දෙකකින් මෙම කොරිඩෝව සමන්විත වේ. මෙම පොලී අනුපාතික දෙක අතර කෙටි කාලීන වෙළෙඳපොළ පොලී අනුපාතිකය දෝලනය වේ.

(ලකුණු 01යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- කෙටි කාලීන පොලී අනුපාතික මත බලපෑම : පොලී අනුපාතික කොරිඩෝවේ ප්‍රධාන අරමුණ වන්නේ කෙටි කාලීන පොලී අනුපාතික විශේෂයෙන් අන්තර් බැංකු එක් දින පොලී අනුපාතික මෙහෙය වීම ය. ණයදීමේ අනුපාතික තැන්පතු අනුපාතික සහ පිළිණපත් වල එළදාව වැනි වෙළෙඳපොළේ සෙසු පොලී අනුපාතික තීරණය වීමේලා මෙම අන්තර් බැංකු ඒක්ෂණ ණය පොලී අනුපාතිකය තීරණාත්මක වැදගත්කමක් උසුලයි. මූල්‍ය පද්ධතියේ ද්‍රවශීලතාව පාලනය කිරීමට උපකාරීවන පරිදි මහ බැංකු නිත්‍ය ණය සහ නිත්‍ය තැන්පතු පොලී අනුපාතික භාවිත කරමින් අන්තර් බැංකු ඒක්ෂණ ණය පොලී අනුපාතිකය අපේක්ෂිත පරාසය තුළ පවත්වා ගනී. (ලකුණු 01යි)

- මූල්‍ය ප්‍රතිපත්තියේ දිශානතිය සංප්‍රේෂණය කිරීම : නිත්‍ය තැන්පතු සහ ණය පොලී අනුපාතිකයන්හි කරන ගැළැපුම් මගින් මහ බැංකුව ආර්ථිකයේ සමස්ත මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම් කරයි. ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීමට අවශ්‍ය නම් මෙම පොලී අනුපාතික පහළ හෙළීමට ඉඩ ඇති අතර එමගින් ණය ගැනීමේ පිරිවැය අඩු කොට බැංකුවලට තවත් ණය දීමට දිරි ගන්වයි. අනික් අතට උද්ධමනය මැඩ පැවැත්වීම සඳහා පොලී අනුපාතික ඉහළ නංවා ණය ගැනීමේ පිරිවැය වැඩි කිරීම සහ අතිරික්ත ද්‍රවශීලතා අඩු කළ හැකි ය. මෙම ගැළැපුම් ඔස්සේ මහ බැංකුවට තම මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවර ආර්ථිකයට පුළුල් ලෙස සම්ප්‍රේෂණය කළ හැකි ය. (ලකුණු 01යි)

- උද්ධමනය පාලනය කිරීම හා ආර්ථික ස්ථායිතාව තහවුරු කිරීම : උද්ධමනය ඉලක්කගත කිරීමේ දී පොලී අනුපාතික කොරිඩෝව ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. කෙටි කාලීන පොලී අනුපාතික කෙරෙහි බලපෑම් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට උද්ධමන පීඩන වක්‍රව පාලනය කළ හැකි ය. ඉහළ උද්ධමන තත්ත්වයක දී නිත්‍ය ණය අනුපාතිකය වැඩි කිරීම මගින් ණය ගැනීම් සහ වියදම් අධෛර්යමත් කොට සමාහාර ඉල්ලුම පහළ හෙළීමට පිළිවන. (ලකුණු 01යි)

- ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම : පොලී අනුපාතික කොරිඩෝව බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට සහාය වේ. අතිරික්ත ද්‍රවශීලතාව ඇති විට නිත්‍ය තැන්පතු පහසුකම් යටතේ ද්‍රවශීලතාව අවශෝෂණය කර ගනු ලැබේ. ද්‍රවශීලතා හිඟයක් පවතින විට නිත්‍ය ණය පහසුකම් යටතේ බැංකු පද්ධතියට ද්‍රවශීලතා මුදා හැරේ.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 05යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

7. (i) 'පොදු දේපළ සම්පත්' නිර්වචනය කර, ඒවා පොදු භාණ්ඩවලින් වෙන් කොට දක්වන්න. (ලකුණු 04යි)

(ii) ශ්‍රී ලංකාවට බහුපාර්ශ්වීය ණය ලබා දෙන මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03යි)

(iii) වෙළෙඳපොළ අසමත්වීම සහ ආණ්ඩුව අසමත්වීම රටක සම්පත් බෙදා වෙන් කිරීමේ අකාර්යක්ෂමතාවට හේතු විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) 2022 වර්ෂයේ දී කල්පිත ආර්ථිකයක තෝරාගත් රාජ්‍ය මූල්‍ය දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|---|---|
| බදු අයභාරය | 1 800 | වර්තන පැවරුම් සහ සහනාධාර | 800 |
| බදු නොවන අයභාරය | 250 | ප්‍රාග්ධන වියදම | 1 000 |
| දීමනා | 50 | ශුද්ධ ණය දීම් | 200 |
| භාණ්ඩ හා සේවා වියදම | 1 200 | ණය ආපසු ගෙවීම් | 1 400 |
| පොලී ගෙවීම් | 1 500 | | |

ඉහත දත්ත යොදා ගනිමින් රජයේ අයවැය ලේඛනයට අදාළ පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වර්තන ගිණුමේ ශේෂය

(ආ) ප්‍රාථමික ගිණුමේ ශේෂය

(ඉ) සමස්ත ශේෂය

(ඊ) දළ මූල්‍යන අවශ්‍යතා (02 × 4 = ලකුණු 08යි)

07. (i) - පොදු දේපළ සම්පත් යනු පුද්ගල සමූහයක් විසින් හවුලේ භුක්තිවිඳින, පරිභෝජනයේ දී තරගකාරිත්වයක් පවතින නමුදු පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි සම්පත් ය. විවිධ පුද්ගලයන්ට මෙම සම්පත් කරා ප්‍රවේශ වී භාවිත කළ හැකි අතර එක් පුද්ගලයෙකුගේ භාවිතය නිසා අන් අයට එහි සුලබතාව අඩු වේ. බොහෝ විට මෙම සම්පත් අධි උපයෝජනය සහ හායනය වීම වැනි ගැටලුවලට ලක් වේ. පොදුබිමේ ඛේදවාචකය ලෙස මෙය හැඳින්වේ.

උදාහරණ : ධීවර සම්පත්, වනාන්තර, තෘණ භූමි, ජල මූලාශ්‍ර, වායුගෝලීය සම්පත්, පිරිසිදු වාතය (ලකුණු 02යි)

- පොදු භාණ්ඩ යනු පරිභෝජනයේ තරගකාරිත්වයක් ඇති පාරිභෝජනයෙන් බැහැර කළ නොහැකි සම්පත් ය. මින් අදහස් වන්නේ එක් පුද්ගලයකු විසින් භාණ්ඩ පරිභෝජනය කිරීම නිසා සෙසු අයට එම භාණ්ඩය පරිභෝජනය කිරීමට ඇති හැකියාව අඩු නොවන බව ය.

උදාහරණ : ජාතික ආරක්ෂාව, වීදි ආලෝකකරණය, මාර්ග සංඥා (ලකුණු 02යි)

නැතහොත්

විකල්ප ප්‍රවේශයකින් පිළිතුරු ලබා දිය හැක.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

| ලක්ෂණය | පොදු දේපළ සම්පත් | පොදු භාණ්ඩ |
|---|---|---|
| පරිභෝජනයේ තරගකාරිත්වය | තරගකාරිත්වයක් ඇත. : එක් පුද්ගලයෙකුගේ පරිභෝජනය සෙසු අයට ලැබෙන ප්‍රමාණය අඩු කරයි. | තරගකාරිත්වයක් නැත : එක් පුද්ගලයෙකුගේ පරිභෝජනය නිසා සෙසු අයට ලැබෙන ප්‍රමාණය අඩු නොවේ. |
| බැහැර කිරීමේ හැකියාව | බැහැර කළ නොහැකි ය : පරිභෝජනය සීමා කිරීම දුෂ්කර හෝ අතිශය පිරිවැය අධික ය. | බැහැර කළ නොහැකි ය : සෙස්සන් බැහැර කිරීම අපහසු ය. නැත්නම් අකාර්යක්ෂම ය. |
| පරිභෝජන ප්‍රතිවිපාක | අධි උපයෝජනය නිසා ක්ෂය වීමක් හෝ හායනය හටගනී. (උදා : අධික ලෙස මසුන් ඇල්ලීම, වන විනාශය) | භාවිතය නිසා ක්ෂයවීමක් හට නොගනී. (උදා : ජාතික ආරක්ෂාව නිසා සියල්ලෝ ම ප්‍රතිලාභ ලබති. |
| උදාහරණ | ධීවර සම්පත්, තෘණ භූමි, ජල සම්පත් | ජාතික ආරක්ෂාව, වීදි අලෝකකරන |

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)
(මුළු ලකුණු 04යි)

(ii) බහු පාර්ශ්වීය ණය ලබා ගත හැකි මූලාශ්‍ර :
- ආසියානු සංවර්ධන බැංකුව (ADB)
- යුරෝපීය ආයෝජන බැංකුව (EIB)
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
- කෘෂි කාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල (IFAD)
- නෝර්ඩික් සංවර්ධන අරමුදල (NDF)
- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා OPEC අරමුදල (OFID)
- ලෝක බැංකුව

(එක් ආයතනයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)
(මුළු ලකුණු 03යි)

(iii) - රජයේ මැදිහත්වීමක් නොමැති නිදහස් වෙළෙඳපොළක සම්පත් භාවිතය අකාර්යක්ෂම වන විට වෙළෙඳපොළ අසමත් වීම සිදුවේ. වෙළෙඳපොළ අසාර්ථකවීම් වල දී සිදුවනුයේ සමාජයීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට සාපේක්ෂව වෙළෙඳපොළ තුළ නිෂ්පාදනය කරන සහ පරිභෝජනය කරන භාණ්ඩ හා සේවා ප්‍රමාණ ඉතා ඉහළ හෝ ඉතා පහළ ප්‍රමාණයන් වේ. මේ තත්ත්වයන් ඇති කරන ප්‍රධාන හේතු කීපයකි.

- පොදු භාණ්ඩ නිෂ්පාදනය නොවීම. : මුදල් ගෙවීමක් නොකරන පුද්ගලයන් ඒවා පරිභෝජනය කිරීමෙන් බැහැර කළ නොහැකි නිසා පොදු භාණ්ඩ කාර්යක්ෂමව සැපයීමට වෙළෙඳපොළට හැකියාවක් නැත. වෙළෙඳපොළ පද්ධතිය පොදු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට සම්පත් වෙන් නොකරයි.

- බාහිරතා තිබීම : සෘණ බාහිරතා ඇති විට භාණ්ඩයේ සම්පූර්ණ සමාජ පිරිවැය එහි මිලෙන් පිළිබිඹු නොවන විට අධි නිෂ්පාදනයකට තුඩු දෙයි. ධන බාහිරතා පවතින විට


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

පුද්ගලයාගෙන් ඔබ්බට ප්‍රතිලාභ ව්‍යාප්ත වන විට එය වෙළෙඳපොළ මිලෙහි පිළිබිඹු නොවන බැවින් ඌන නිෂ්පාදනයකට මඟ පාදයි. මේ අවස්ථා දෙකේ දී සම්පත් වෙන් කිරීම අකාර්යක්ෂම වේ.

- අපූර්ණ තරගය : ඒකාධිකාරය, කතිපයාධිකාරය, ඒකාධිකාරී තරගය වැනි වෙළෙඳපොළ අපූර්ණතා නිසා සම්පත් භාවිතය අකාර්යක්ෂම වේ. මෙම අවස්ථාවල දී නිෂ්පාදන ආයතනවලට නිමැවුම සීමා කොට මිල ඉහළ නැංවිය හැකි ය. එය පාරිභෝගික සුභසාධනය පහළ හෙළයි. ලාභ ඉහළ නංවා ගැනීමට මෙම ආයතන සැපයුම සීමා කරයි. සමාජයීය වශයෙන් ප්‍රශස්ත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් නිෂ්පාදනය කරයි. සම්පත් භාවිතය අකාර්යක්ෂම වී වෙළෙඳපොළ අසමත්වීම් හට ගනී.

- අසමමිතික තොරතුරු : ගනුදෙනුවක දී එක් පාර්ශ්වයකට වඩා හොඳ නිවැරදි තොරතුරු ප්‍රමාණයක් අනික් පාර්ශ්වයට වඩා ඇති විට එම ගනුදෙනුව අහිතකර තේරීමකට ඉඩ සලසයි. තොරතුරු අපූර්ණතාව, සම්පත් භාවිතය අකාර්යක්ෂම කරයි.

**(වෙළෙඳපොළ අසමත්වීම් සඳහා බලපාන එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)**

- වෙළෙඳපොළ අසාර්ථකත්වයන් නිවැරදි කිරීම අරමුණු කරගෙන කරනු ලබන වෙළෙඳපොළ තුළ රජයේ මැදිහත්වීම් නිසා තවදුරටත් අකාර්යක්ෂමතාවන් හටගන්නා විට ආණ්ඩුව අසමත් වේ යයි කියනු ලැබේ. මෙවැනි අසාර්ථකත්වයන් බිහිකරන අවස්ථා කීපයක් ඇත.

- නියාමන ක්‍රියාවලිය : නියාමකයන් මහජන අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටිනවා වෙනුවට නියාමනය කළ යුතු කර්මාන්තයේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින විට අකාර්යක්ෂමතා හටගනී. සම්පත් භාවිතය අකාර්යක්ෂම වේ. තරගකාරිත්වය හෝ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කරනවා වෙනුවට තම අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම පිණිස රෙගුලාසි ඇතිකර ගැනීමට කර්මාන්ත කරුවෝ බලපෑම් කරයි.

- ප්‍රමාණවත් නොවන හෝ අධික නියාමනය : සමහර විට රජයේ රෙගුලාසි ඉතා දැඩි හෝ ලිහිල් විය හැකි ය. අධි නියාමනය ව්‍යාපාර සඳහා ඉහළ අනුකූලතා පිරිවැයක් තරගකාරිත්වය හා නව්‍යතා අඩු කිරීම සහ අකාර්යක්ෂමතාවට හේතු විය හැකි ය. උදාහරණ වශයෙන් අධික පාරිසරික රෙගුලාසි මගින් ආර්ථික ක්‍රියාකාරකම් අඩාල විය හැකි ය. එසේම කුඩා නියාමනයන් සම්පත් ක්ෂයවීම්වලට හා පාරිසරික හානිවලට හේතු විය හැකි ය.

- විකෘති බදු සහ සහනාධාර (Distortionary Taxes and Subsidies) : බදු සහ සහනාධාර මගින් අපේක්ෂා කරනුයේ වෙළෙඳපොළ අසාර්ථකත්වයන් නිවැරදි කිරීම වුවත් ඒවා අවභාවිතයට යොදා ගත හැකි ය. සහනාධාර නිසා ඇතැම් අංශවල අධි නිෂ්පාදනයක් ඇති විය හැකි ය. බදු මගින් මිල ගණන් විකෘති කළ හැකි අතර එහි ප්‍රතිඵල වශයෙන් පරිභෝජනය හා නිෂ්පාදනය අධෛර්යමත් විය හැකි ය.

- නිලධාරිවාදී අකාර්යක්ෂමතා : නිලධාරිවාදී අකාර්යක්ෂමතා නිසා ආණ්ඩුව අසාර්ථවීම් සිදු වේ. තීරණ ගැනීම මන්දගාමී වීම, වගවීම නොමැති කම හෝ නාස්තිකාර වියදම් වැනි රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතා සම්පත් භාවිතය අකාර්යක්ෂම වේ. ඒ නිසා සමාජ අවශ්‍යතා සපුරාලීමට රජය අසමත් වනු ඇත.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- දේශපාලන දිරිගැන්වීම් : රජයේ තීරණ දිගු කාලීන සමාජ සුබසාධනයට වඩා කෙටි කාලීන දේශපාලන අවශ්‍යතාවලට බලපෑම් කළ හැකි ය. දේශපාලනඥයන්ට මිල පාලනය හෝ ආරක්ෂණවාදී පියවර හෝ වැනි ජනප්‍රිය නමුත් ආර්ථික වශයෙන් අකාර්යක්ෂම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ හැකි ය. එමගින් වෙළෙඳපොළ සංඥා විකෘති වීමත් සම්පත් වැරදි ලෙස බෙදීයාමත් හට ගනී.

- කුලී සෙවීම් හැසිරීම (Rent - Seeking Behavior) : ව්‍යාපාරික පිරිස් සහ ඇතැම් කණ්ඩායම් තමන්ට ප්‍රතිලාභ සැලසෙන වාසි සහගත ප්‍රතිපත්ති දේශපාලනඥයන් ලවා සම්පාදනය කර ගැනීමට යොමු වීම නිසා ආණ්ඩුව අසාර්ථක වීම් ඇති වේ. ආර්ථික වශයෙන් වඩාත් කාර්යක්ෂම අංශවලට සම්පත් බෙදී යනවා වෙනුවට දේශපාලනිකව සම්බන්ධතා ඇති කර්මාන්ත සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යොමු විය හැකි ය. ඵලදායිතාව අඩු ඇතැම් අංශවල අධි ආයෝජනයක් සිදු විය හැකි ය. මෙය සම්පත් භාවිතය අකාර්යක්ෂම කරයි.

**(ආණ්ඩුවේ අසාර්ථකවීම්වලට බලපාන එක් හේතුවකට ලකුණු 01 බැගින් හේතු දෙකකට ලකුණු 02යි)**
**(මුළු ලකුණු 05යි)**

(iv)(අ) - වර්තන ගිණුමේ ශේෂය :

වර්තන ගිණුමේ ශේෂය = රජයේ මුළු ආයභාරය - රජයේ වර්තන වියදම්

= (බදු ආයභාරය + බදු නොවන ආයභාරය) - (භාණ්ඩ හා සේවා මත වියදම + වර්තන පැවරුම් සහ සහනාධාර + පොලී ගෙවීම්) **(ලකුණු 01යි)**

= $(1800+250)-(1200+800+1500)$

= $2050-3500$

= $-1450$

= රු.බිලියන 1450 හිඟයකි. **(ලකුණු 01යි)**

(ආ) - ප්‍රාථමික ගිණුමේ ශේෂය = දීමනා ඇතුළු රජයේ ආයභාරය - පොලී ගෙවීම් හැර රජයේ මුළු වියදම

= (බදු ආයභාරය + බදු නොවන ආයභාරය + දීමනා) - (පොලී ගෙවීම් රහිත වර්තන වියදම + ප්‍රාග්ධන වියදම + ශුද්ධ ණය දීම්) **(ලකුණු 01යි)**

= $(1800+250+50)-(3500-1500+1000+200)$

= $2100-3200$

= $-1100$

= රු.බිලියන 1100ක හිඟයකි. **(ලකුණු 01යි)**

(ඉ) - සමස්ත ශේෂය = (මුළු ආයභාරය + දීමනා) - (පුනරාවර්තන වියදම + ප්‍රාග්ධන වියදම) **(ලකුණු 01)**

= $(1800+250+50)-(1200+800+1500+1000+200)$

= $2100-4700$

= $-2600$ **(ලකුණු 01යි)**

= රු.බිලියන 2600 හිඟයකි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ඊ) - දළ මූල්‍යන අවශ්‍යතා = සමස්ත අයවැය හිඟය + ණය ආපසු ගෙවීම් (ලකුණු 01යි)

= 2600 + 1400

= 4000

= රු.බිලියන 4000 (ලකුණු 01යි)

(මුළු ලකුණු 08යි)

**8.** (i) A රටට ශ්‍රම ඒකකයකින් රෙදිපිළි ඒකක 10ක් හෝ පාවහන් කුට්ටම් 5ක් හෝ නිපදවිය හැකි බව ද, B රටට ශ්‍රම ඒකකයකින් රෙදිපිළි ඒකක 15ක් හෝ පාවහන් කුට්ටම් 10ක් හෝ නිපදවිය හැකි බව ද සලකන්න.

(අ) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටකට ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ආ) අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් සිදුවීම සඳහා රෙදිපිළි සහ පාවහන් අතර ඇතිවිය හැකි හුවමාරු අනුපාතික පරාසය තීරණය කරන්න. (ලකුණු 02යි)

(ii) 1977න් පසු ශ්‍රී ලංකාව අඛණ්ඩ වෙළෙඳ හිඟයකට මුහුණ දී සිටීමට බලපා ඇති ප්‍රධාන හේතු මොනවා ද? (ලකුණු 04යි)

(iii) ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ අපනයන තරගකාරීත්වය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04යි)

(iv) ව්‍යවහාර මුදල් ඒකකයේ බාහිර අගය ක්ෂයවීමක ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 06යි)

08. (i) (අ) - A රටෙහි රෙදිපිළි ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය :

- රෙදිපිළි ඒකකයක ආවස්ථික පිරිවැය $= \frac{3}{10} = 0.5$

පාවහන් කුට්ටම් 0.5කි.

- B රටෙහි රෙදිපිළි ඒකකයක ආවස්ථික පිරිවැය $= \frac{10}{15} = 0.67$ (ලකුණු 01යි)

පාවහන් කුට්ටම් 0.67කි.

- A රටෙහි පාවහන් කුට්ටමක් නිපදවීමේ ආවස්ථික පිරිවැය $= \frac{10}{5}$ = රෙදිපිළි ඒකක 2කි.
- B රටෙහි පාවහන් කුට්ටමක් නිපදවීමේ ආවස්ථික පිරිවැය $= \frac{15}{10}$ = රෙදිපිළි ඒකක 1.5කි.

(ලකුණු 01යි)

- මේ අනුව රෙදිපිළි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ඇත්තේ A රටට ය. (අඩුම ආවස්ථික පිරිවැය) (ලකුණු 01යි)
- පාවහන් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ඇත්තේ B රටට ය. (අඩුම ආවස්ථික පිරිවැය)

(ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) හුවමාරු අනුපාතික පරාසය :

- අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් සිදුවීමට නම් හුවමාරු අනුපාතිකය රටවල් දෙකෙහි එක් එක් භාණ්ඩය ආවස්ථික පිරිවැය අගයන් අතර තීරණය විය හැක.

- A රටෙහි රෙදිපිළි ඒකකයක ආවස්ථික පිරිවැය සපත්තු කුට්ටම් 0.5ක් වන අතර B රටෙහි එය පාවහන් කුට්ටම් 0.67කි.

  මේ අනුව රෙදිපිළි ඒකකයක හුවමාරු අනුපාතය පාවහන් කුට්ටම් 0.5ත් 0.67ත් අතර තීරණය විය යුතු ය. (ලකුණු 01යි)

- A රටෙහි පාවහන් කුට්ටමක ආවස්ථික පිරිවැය රෙදිපිළි ඒකක 2ක් වන අතර B රට එම ප්‍රමාණය රෙදිපිළි ඒකක 1.5කි. මේ අනුව පාවහන් කුට්ටමක හුවමාරු අනුපාතිකය රෙදිපිළි ඒකක 2ත් 1.5ත් අතර තීරණය විය යුතු ය. (ලකුණු 01යි)

(මුළු ලකුණු 06යි)

(ii) අඛණ්ඩ වෙළෙඳ හිඟයට බලපා ඇති ප්‍රධාන හේතු :

- ප්‍රාථමික භාණ්ඩ අපනයන මත රඳා පැවැත්ම
- අපනයන පදනම සීමාසහිත වීම
- ගෝලීය මිල ගණන් උච්චාවචනයන්ගේ අවදානම
- ආනයන මත දැඩි රැඳියාව (ඛණිජ තෙල්, යන්ත්‍ර සූත්‍ර, අතරමැදි භාණ්ඩ තිරිඟු පිටි, සීනි වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය)
- කාර්මික අපනයන ක්ෂේත්‍රය ඉතා දුබල වීම (නැගෙනහිර ආසියාතික රටවල මෙන් අපනයන කේන්ද්‍රීය කාර්මික සංවර්ධනය ශ්‍රී ලංකාවේ නොසිදු විය)
- නව්‍යතා අතිශයින් සීමිත වීම සහ ඵලදායිතාව පහළ මට්ටමක තිබීම
- අධි තක්සේරු වූ විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යාම
- දේශීය ඉල්ලුම ඉහළ යාම (ජනගහන වර්ධනය, නාගරීකරණය, පරිභෝජන වාදය වැනි හේතු මත ආනයන භාණ්ඩ සඳහා විශාල ඉල්ලුමක් හටගෙන ඇත)
- 1970 ගණන් අවසාන භාගයේ හඳුන්වාදුන් ආර්ථික ලිහිල්කරණය නිසා ආනයන විශාල වශයෙන් ඉහළ යාම
- විදේශ ආයෝජන අතිශයින් සීමිත වීම (අපනයන කේන්ද්‍රීය කර්මාන්ත සඳහා ප්‍රමාණවත් විදේශ ආයෝජනයන් නොවී ය.)
- දේශපාලන අස්ථාවරත්වය සහ අභ්‍යන්තර සිවිල් යුධ තත්ත්වයන් (ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ නිශ්චිතතාවක් නොවී ය.)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04කි.)

(මුළු ලකුණු 04යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) අපනයන තරගකාරීත්වය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග :

- අපනයන පදනම විවිධාංගීකරණය කිරීම : ඇඟලුම්, තේ, රබර්, පොල් වැනි පටු නිෂ්පාදිත පරාසයක් මත ශ්‍රී ලංකාවේ අපනයන පදනම රඳා සිටී. ඉලෙක්ට්‍රොනික්ස්, ඖෂධ, තොරතුරු තාක්ෂණ සේවා වැනි ඉහළ එකතු කළ අගයන් සහිත නිෂ්පාදිත කරා විවිධාංගීකරණය කිරීමෙන් ගෝලීය වෙළෙඳපොළේ තරග කිරීමට හැකි වේ.

- එකතු කළ අගය සහිත නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම : අමුද්‍රව්‍ය ලෙස හෝ අඩු එකතු කළ අගයන් සහිත භාණ්ඩ අපනයනය කරනවා වෙනුවට අගයදාමයේ ඉහළට ගොස් සන්නාම සහිත භාණ්ඩ වෙළෙඳපොළට යොමු කළ යුතු ය.

- කාර්මික ප්‍රදේශ සහ අපනයන සැකසුම් කලාප ඇති කළ යුතු ය : ගෝලීය මට්ටමේ පහසුකම් සහිත කාර්මික කලාප වරාය හා ගුවන් තොටුපොළ ආසන්නයේ ගොඩනැගීම නිසා අපනයන කේන්ද්‍රීය විදේශ ආයෝජනය ආකර්ශණීය කරගත හැකි වේ. ඉහළ එකතු කළ අගය සහිත භාණ්ඩ නිපදවීමට මේ මගින් දිරිමත් කළ හැකි ය.

- ඵලදායිතාව සහ නව්‍යතා ඉහළ නැංවීම : රජය සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයන්හි ආයෝජන වැඩි කොට කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා අංශයේ අපනයන වැඩි කිරීමට අදාළ නව්‍යතා හඳුන්වා දිය යුතු ය. නව නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රම හඳුන්වාදීම සඳහා විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවලට ආධාර කළ යුතු ය.

- පුහුණු කිරීමේ සහ අධ්‍යාපන වැඩසටහන් තුළින් ශ්‍රමිකයන්ගේ නිපුණතා ඉහළ නැංවිය යුතු ය : ඵලදායිතාව සහ තරගකාරිත්වය දැඩි කිරීම සඳහා නිපුණතා සංවර්ධනය ඉතා වැදගත් වේ.

- ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කළ යුතු ය : ව්‍යාපාර කරගෙන යාම් පහසුකම් දර්ශකයේ ඉහළට යාම, දූෂණය පිටුදැකීම සහ බදු ක්‍රමය සරල කිරීම වැනි ක්‍රියාමාර්ග මගින් අපනයනයට යොමු වූ විදේශ ආයෝජකයන් ආකර්ශනය කර ගත හැකි වේ.

- ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් : එවැනි ගිවිසුම් ඔස්සේ යුරෝපා සංගමය, එක්සත් ජනපදය, නැගී එන නැගෙනහිර ආසියාතික රටවල වෙළෙඳපොළ කරා ප්‍රවේශය ශක්තිමත් කර ගත යුතු ය.

- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත විය යුතු ය : ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් තම නිෂ්පාදිතවල ගුණාත්මකභාවය සහ ආරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගතව නිෂ්පාදනය කරනවාද යන්න තහවුරු කළ යුතු ය. ISO සහතික, සාධාරණ වෙළෙඳාම පිළිබඳ සහතික, කාබනික නිෂ්පාදිත පිළිබඳ සහතික ලබා ගැනීම තුළින් ගෝලීය තරගකාරිත්වයට මුහුණ දීමට හැකියාව ලැබේ.

- දූෂණ විරෝධී ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම : දූෂණය අඩු කිරීමෙන් ආණ්ඩුකරණයේ විනිවිදභාවය ඉහළ නැංවීමක් තුළින් අපනයනකරුවන්ට පිරිවැය බෙහෙවින් අඩු කර ගත හැකි වන අතර විදේශ ආයෝජන තවදුරටත් ශක්තිමත් කර ගත හැකි වේ.

- ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඩිජිටල්කරණය ශක්තිමත් කිරීම : ඩිජිටල් යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ඔස්සේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ගෝලීය වෙළෙඳපොළවලට



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සම්බන්ධ කර ගැනීමට හැකි වනු ඇත.

- හරිත බලශක්ති ප්‍රවර්ධනය : බලශක්ති පිරිවැය අඩු කර ගැනීමටත් පරිසර හිතකාමී කාර්මීකරණයක් ගොඩනගා ගැනීමටත් දායක වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)
(මුළු ලකුණු 04යි)

(iv) මුදලේ බාහිර අගය ක්ෂයවීමක සාර්ව ආර්ථික ප්‍රතිවිපාක :

- අපනයන දිරිමත් කරයි. එම රටේ භාණ්ඩ හා සේවා විදේශිකයනට ලාභදායක වනු ඇත. අපනයන ඉල්ලුම වැඩි වී වෙළෙඳ ශේෂය ශක්තිමත් වීමට ඉඩ තිබේ.

- ආනයන පිරිවැය ඉහළ නගී. දේශීය වෙළෙඳපොළේ ආනයන භාණ්ඩවල මිල ඉහළ යන අතර ආනයන සඳහා ඉල්ලුම අධෛර්යමත් විය හැකි ය. ආනයන ආදේශක දේශීය භාණ්ඩ වෙළෙඳපොළේ ඇත්නම් වෙළෙඳ ශේෂය යහපත් වීමට මෙය හේතු වේ.

- උද්ධමනය ආනයනය කෙරේ. ආනයනික භාණ්ඩවල මිල විශාල වශයෙන් ඉහළ යාම. (විශේෂයෙන් ඛනිජ තෙල්, ආහාර, අමුද්‍රව්‍ය) නිසා පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනයක් ඇති විය හැකි ය. ඉහළ ආනයන මිල ගණන් හේතුවෙන් දේශීය මිල මට්ටම ඉහළ යාමත් එයට මුහුණ දීම සඳහා වැටුප් මට්ටම් වැඩිකර ගැනීමට තරගකිරීමක් හේතුවෙන් වැටුප් මිල දඟර ස්වරූපයේ උද්ධමනීය පීඩන හටගනී.

- අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී ආනයන අඩු වී අපනයන ආදායම ඉහළ යන විට ශුද්ධ අපනයන වැඩි වී සමාහාර ඉල්ලුම ශක්තිමත් වේ. මෙය ආර්ථික වෘද්ධියට හිත කර වේ. අනික් අතට ඉහළ ආනයන මිල ගණන් සහ දේශීය උද්ධමනය නිසා පරිභෝජන ඉල්ලුම හා ආයෝජන පහළ වැටීමෙන් ආර්ථික වෘද්ධියට අහිතකර බලපෑමක් ඇති විය හැකි ය.

- විදේශ ණය සේවාකරණ පිරිවැය ඉහළ නගී. විශාල වශයෙන් විදේශ ණය ලබා ගෙන ඇති රටකට මුදලේ අගය ක්ෂය වීම නිසා දේශීය මුදලින් ණය සේවා පිරිවැය ඉහළ නගී. රාජ්‍ය මූල්‍ය මත දැඩි පීඩනයක් ඇතිකරයි.

- මුදල ක්ෂය වී ඇති විට විදේශිකයන්ට එම රටේ වත්කම මිලයට ගැනීම වඩා පහසු වනු ඇත. මෙය එක් අතකින් විදේශ ආයෝජන වැඩි වීමට බලපායි.

- ප්‍රාග්ධන පලායාම් සහ ආයෝජන විශ්වාසනීයත්වය බිඳ වැටීම් ඇති විය හැකි ය. මුදලේ අගය ක්ෂය වන විට ඉදිරි කාලයේ දී තව තවත් ක්ෂය වේය යන බිය නිසා ආයෝජකයන් ප්‍රාග්ධනය ඉවත් කර ගැනීමට ක්‍රියාකරනු ලැබේ. විශේෂයෙන් කළඹ ආයෝජන කොටස් වෙළෙඳපොළවල ආයෝජන සම්බන්ධයෙන් මෙය බොහෝ විට සිදු වේ.

- පොලී අනුපාතික ඉහළ යාමේ අවදානම : උද්ධමනය පාලනය කොට ආර්ථිකය ස්ථාවර තත්ත්වයකට ගෙන ඒම සඳහා මහ බැංකුව පොලී අනුපාතික ඉහළ නැංවිය හැකි ය. ඉහළ පොලී අනුපාතික ආයෝජන අධෛර්යමත් කිරීම ඔස්සේ ආර්ථික වෘද්ධියට අහිතකර ලෙස බලපායි.

- ආදායම් විෂමතා පුළුල් වීම : අඩු ආදායම්ලාභීන් තම ආදායම් විශාල කොටසක් අත්‍යාවශ්‍ය ආහාර හා ඉන්ධන මත වැය කරන බැවින් උද්ධමනයේ පීඩන එම කණ්ඩායම් වෙත දැඩිව පතිත විය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු හයකට ලකුණු 06යි)
(මුළු ලකුණු 06යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සලකා බලන දෙයක් නොවේ. එය බහුමානීය ප්‍රපංචයකි. සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනයට ප්‍රවේශය, පාරිසරික තිරසාර භාවය වැනි සමාජයීය, දේශපාලන හා පාරිසරික වැනි පැතිකඩ ද ඊට අදාළ වේ. එවැනි ආර්ථික නොවන පැතිකඩ පිළිබඳ කිසිදු කරුණක් ඒක පුද්ගල ආදායම පෙන්නුම් නොකරයි.

- සමාජ යහපැවැත්ම (social wellbeing) ග්‍රහණය කර නොගනී. ආයු අපේක්ෂාව, සාක්ෂරතාව, ජීවන තත්ත්වය වැනි දර්ශක සංවර්ධනය අවබෝධ කර ගැනීම සඳහා තීරණාත්මක වන නමුදු ඒවා ඒක පුද්ගල ආදායමෙන් පිළිබිඹු නොවේ. එහි ප්‍රතිඵල වශයෙන් ඒක පුද්ගල ආදායමෙන් සමාන වූ රටවල් දෙකක් අතර සමාජයීය හා මානව සංවර්ධනයේ විශාල වෙනස්කම් තිබිය හැකි ය.

- ජීවන තත්ත්වය හෝ යහපැවැත්ම පිළිබිඹු නොකරයි. රටවල් අතර ජීවන වියදම වෙනස් වේ. එහෙත් ජීවන වියදමේ වෙනස්කම් සඳහා ඒක පුද්ගල ආදායමේ වෙනස්කම් වග නොකියයි. ඒක පුද්ගල ආදායම ඩොලර් අගයෙන් මනිනු ලැබුවත් ඩොලරයේ ක්‍රය ශක්තිය රටවල් අතර වෙනස් විය හැකි ය.

- ජීවිතයේ ගුණාත්මක තත්ත්වය පෙන්නුම් නොකරයි. මිනිසුන්ගේ ජීවත තත්ත්වයට සහ සමස්ත යහපැවැත්මට බලපාන යටිතල පහසුකම්, පොදු සේවා, නිවාස, පරිසරය යනාදියේ ගුණාත්මක තත්ත්වය ඒක පුද්ගල ආදායම පෙන්නුම් නොකරයි.

- පරිසර තිරසාරභාවය සහ සම්පත් ක්ෂය වී යාම වැනි කරුණු ගැන එය අවධානය යොමු නොකරයි. ආර්ථිකයේ නිමැවුම් මට්ටම පමණක් සැලකිල්ලට ගන්නා අතර ආර්ථික ක්‍රියාකාරකම් තිරසාර ද නැද්ද යන්න නොවිමසයි. යම් රටක් ස්වාභාවික සම්පත් අධි උපයෝජනය කරමින් ඉතා ඉහළ ඒක පුද්ගල ආදායමක් හිමි කර ගත හැකි ය. එහෙත් එය සම්පත් හායනය නිසා රටේ අනාගත අභිවෘද්ධිය අභියෝගයට ලක් කරයි.

- විදේශ ආදායම් වල දක්නට ඇති දැඩි චංචල ස්වභාවය ඒක පුද්ගල ආදායමට බලපායි. විදේශ ප්‍රේෂණ, විදේශ ආයෝජන ආදායම් ඒක පුද්ගල ආදායමට ඇතුළත් වේ. මෙම ආදායම් ප්‍රවාහ බාහිර සාධක මත රඳා පවත්නා බැවින් ඒවා මත පදනම් වූ ඒක පුද්ගල ආදායම සංවර්ධනය පිළිබඳ විකෘති වූ මිනුමක් සැපයිය හැකි ය.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනකට ලකුණු 03යි)**

**(මුළු ලකුණු 05යි)**

(ii) මෑත කාලයේ දී දරිද්‍රතාව ඉහළ යාමට බලපා ඇති හේතු :

- ආර්ථික අර්බුදය සහ ආර්ථික නිශ්චලනය : දැරිය නොහැකි තරම් ප්‍රමාණයක විදේශ ණය ලබා ගැනීම නිසා ශ්‍රී ලංකාව ඉතා බරපතල ණය අර්බුදයකට මුහුණ පෑවේ ය. 2022 දී ශ්‍රී ලංකාව ණය ගෙවා ගත නොහැකි බංකොළොත් රාජ්‍යයක තත්ත්වයට පත් වීම නිසා කිසිදු මූලාශ්‍රයකින් තවදුරටත් ණය ලබා ගත නොහැකි විය. මේ ණය බර හේතුවෙන් සමාජ ආරක්ෂණ සේවා, යටිතල පහසුකම්, අවදානම් තත්ත්වයේ සිටින අයට ආධාර සැපයීම වැනි කිසිවකට මුදල් සපයා ගැනීම අපහසු වීමෙන් දරිද්‍රතා මට්ටම් ඉහළ ගියේ ය.

- උද්ධමනය සහ ජීවන වියදම ඉහළ යාම : ආර්ථික අර්බුදයේ ක්ෂණික ප්‍රතිඵලයක් වූයේ විශාල ලෙස මිල ගණන් ඉහළ ගොස් ප්‍රබල උද්ධමන පීඩනයක් ආර්ථිකය මත පතිත වීම ය. ආහාර හා ඉන්ධන මිල විශාල ලෙස ඉහළ ගිය අතර කුටුම්බයේ ක්‍රය ශක්තිය දැඩි ලෙස අඩු විය. අඩු ආදායම්ලාභීන්ට මෙය ප්‍රබල අන්දමින් බලපෑවේ ය.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- මුදලේ බාහිර අගය ක්ෂය වීම : විදේශ විනිමය සංචිත මුළු මනින් ම සිඳී යාම නිසා රුපියලේ අගය දරුණු ලෙස ක්ෂය විය. අත්‍යවශ්‍ය ආනයනික ආහාර, ඉන්ධන, ඖෂධ වැනි භාණ්ඩ මිල ශීඝ්‍රයෙන් වැඩි විය.

- රාජ්‍ය අංශයේ දූෂණය හා නාස්තිය : මේ නිසා අර්බුදයේ අහිතකර බලපෑම් තව තවත් උග්‍ර කළේ ය. රාජ්‍ය අංශයේ අකාර්යක්ෂම කළමනාකරණය නිසා සම්පත් අවභාවිතයට පත් විය. දරිද්‍රතාව දුරලීම් වැඩසටහන් සඳහා යොදවා ගත හැකිව තිබූ රාජ්‍ය සම්පත් දූෂණය හා නාස්තිය නිසා විනාශ වී ගියේ ය.

- කෝවිඩ් - 19 වසංගතය : විදේශ විනිමය ඉපයීම සඳහා සංචාරක ව්‍යාපාරය මත දැඩිව රඳා පැවැති ශ්‍රී ලංකා ආර්ථිකය කෝවිඩ් වසංගතය නිසා සංචාරක ව්‍යාපාරය බිඳ වැටුනේ ය. සංචාරක කර්මාන්තයේ නිරත ව සිටි විශාල පිරිසකගේ රැකියා අහිමි වී අන්ත දරිද්‍රතාවකට මුහුණ දීමට සිදු විය.

- ඉහළ විරැකියාව සහ ඌන සේවා නියුක්තිය : ආර්ථික අර්බුදයත් කෝවිඩ් වසංගතයත් නිසා සංචාරක ව්‍යාපාරය, ඉදිකිරීම් ක්ෂේත්‍රය, නිෂ්පාදන කර්මාන්ත අංශවල රැකී රක්ෂා අහිමි වී ගියේ ය. කුටුම්බ ආදායම් පහළ බැසීමට සහ දරිද්‍රතාව ඉහළ යාමට එය හේතු විය.

- කෘෂි කාර්මික අංශය මුහුණදුන් අභියෝග : 2021 වර්ෂයේ දී කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ රසායනික පොහොර භාවිතය නතර කොට කාබනික වගාවට යොමු වීමට රජය තීරණය කිරීම නිසා සෑම කෘෂි කාර්මික ක්ෂේත්‍රයක විශාල බිඳවැටීමක් සිදු විය. සහල් හිඟ වීම, ආහාර මිල ඉහළ යාම ගොවි ජනතාවගේ ආදායම් අහිමි වීම සියල්ලම දරිද්‍රතාව ඉහළ නැගීමට දායක විය.

- බාහිර කම්පන : ඛණිජ තෙල්, ආහාර ද්‍රව්‍ය සහ පොහොර වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ වල ගෝලීය මිල ගණන් ඉහළ යාමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල විය.

- මැද පෙරදිග යුධ ගැටුම්, රුසියානු - යුක්‍රේන යුද්ධය වැනි හේතු නිසාත් විදේශ ප්‍රේෂණයන්ට විශාල පසුබෑමක් හට ගත්තේ ය. කුටුම්බ ආදායම් අඩු වී දරිද්‍රතාව ඉහළ යාමට මෙයද වැදගත් හේතුවක් විය.

- සමාජ ආරක්ෂණ සහ සුභසාධන වැඩසටහන් ප්‍රමාණවත් නොවීම.: ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක වුවද මහා පරිමාණයෙන් වර්ධනය වූ ආර්ථික අර්බුදය හා දරිද්‍රතාවේ ඉහළ යාම හමුවේ සමාජ ආරක්ෂණ වැඩසටහන් ප්‍රමාණවත් නොවී ය. රාජ්‍ය මූල්‍ය අර්බුදය නිසා සමාජ ආරක්ෂණය සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් යොමු කිරීමට ද රජය අසමත් වූයේ ය.

- දේශගුණික විපර්යාසවල බලපෑම : ගංවතුර, නියං, නාය යාම් වැනි ස්වාභාවික උපද්‍රව රාශියක්ම මෑත කාලයක පටන් ශ්‍රී ලංකාව දැඩි ලෙස මුහුණ දෙමින් සිටී. මේ උපද්‍රව නිසා කෘෂි කාර්මික ඵලදාව, ජන ජීවිතයේ ක්‍රියාකාරකම් සියල්ලක්ම බිඳ වැටීමට ලක් වීම ද දරිද්‍රතාව ඉහළ යාමට බලපා ඇති වැදගත් සාධකයකි.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

**(මුළු ලකුණු 04යි)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) ආණ්ඩුකරණයේ දුබලතා සහ දූෂණය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට බලපාන ආකාරය :

- ආණ්ඩුකරණයේ දුබලතාව සහ දූෂණය විවිධ යාන්ත්‍රණයන් ඔස්සේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය අඩාල කරයි.

- සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදා වෙන් කෙරේ. ආයෝජනයන් දේශපාලන හිතවත්කම් හා අවශ්‍යතා මත සිදු වේ. වැඩි ම අවශ්‍යතාවක් හෝ ඉහළ ප්‍රතිලාභයක් සහිත ප්‍රදේශ කරා ආයෝජනය යොමු වෙනවා වෙනුවට දේශපාලනිකව සම්බන්ධ පුද්ගලයන් හෝ ප්‍රදේශ කරා ආයෝජනයට යොමු වේ.

- දූෂණය නිසා මහජන මුදල් ඵලදායි ආයෝජනවලින් ඉවතට හරවයි.

- දුර්වල ආණ්ඩුකරණය ආයෝජනයට අහිතකර ලෙස බලපායි. දුර්වල ආණ්ඩුකරණයේ ලක්ෂණත් වන එකිනෙකට පරස්පර ප්‍රතිපත්ති, දේපොළ හිමිකම් සුරක්ෂිත නොවීම, නියාමන පිළිබඳ විනිවිදභාවයන් නොමැති වීම යන කරුණු නිසා ආර්ථිකයේ දැඩි අවිනිශ්චිතතාවන් ඇති වේ.

- දූෂණය නිසා ව්‍යාපාර කර ගෙන යාමේ පිරිවැය ඉහළ යයි. මේ නිසා දේශීය හා විදේශීය ආයෝජන අධෛර්යමත් වේ.

- රාජ්‍ය සේවා සැපයීමේ කාර්යක්ෂමතාව අඩු වේ. දුර්වල ආණ්ඩුකරණයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාද සහ නිලධාරිවාදී අකාර්යක්ෂමතා ඇති වන අතර අවශ්‍යකරන සේවාකරන ප්‍රවේශ වීම පුරවැසියනට ඉතා දුෂ්කර වනු ඇත.

- දූෂණය කරන කොට ප්‍රමිතියෙන් තොර පොදු භාණ්ඩ සැපයීමක් සිදු විය හැකි ය. මක් නිසාදයත් ඒවාට අදාළ කොන්ත්‍රාත්තු සහ ව්‍යාපෘති කුසලතා මත නොව අනුග්‍රහය මත ප්‍රදානය කිරීමට යොමු වීම නිසා ය.

- ආණ්ඩුව කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටේ. දුර්වල ආණ්ඩුකරණය නිසා පක්ෂග්‍රාහී වීම, වගවීමෙන් තොර වීම, අසාධාරණයට ලක් වීම ආදී අහිතකර සංජානන මහජනයා රජය කෙරෙහි ඇතිකර ගනී. දූෂණය නිසා රාජ්‍ය ආයතන කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටේ. එවිට රාජ්‍ය ප්‍රතිපත්ති කෙරෙහි මහජන සහයෝගය නොලැබේ. සමාජ සහජීවනය අනතුරට පත් වේ.

- අයහපත් රාජ්‍යකරණයේ ප්‍රතිඵලයක් වන්නේ ආර්ථික හා සමාජය අභියෝග ඵලදායි ලෙස කළමනාකරණය කළ නොහැකි දුර්වල ආයතනික රාමුවක් බිහිවීම ය. දූෂණය නෛතික හා අධිකරණ පද්ධති දුර්වල කරයි. ඒ හේතුවෙන් ගිවිසුම් බලාත්මක කිරීම, දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම දුෂ්කර වනු ඇත. මේ නිසා දිගු කාලීන ආර්ථික සැලසුම් හා තිරසාර වර්ධනය අධෛර්යමත් කරයි.

- අයහපත් ආණ්ඩුකරණය සහ දූෂණය රාජ්‍ය මූල්‍ය ස්ථායිතාවට බලපායි. අයවැය වැරදි කළමනාකරණයට යොමු විය හැකි අතර තිරසාර නොවන ණය සමුච්චනයක් ද ඇති විය හැකි ය. ව්‍යාපාරික ආයතන සහ පුද්ගලයන් නිලධාරීන්ට අල්ලස් දී බදු පැහැර හැරීම නිසා දූෂණය රාජ්‍ය ආදායම් අඩු වීමට බලපායි. මේ නිසා සංවර්ධනය සඳහා අරමුදල් සපයා ගැනීම සහ සාර්ව ආර්ථික ගැටලු විසඳා ගැනීමට රජයට ඇති හැකියාව සීමා වේ.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- දුර්වල ආණ්ඩුකරණය සහ දූෂණය නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය අඩාල කරයි. ව්‍යාපාරික පරිසරය පිළිබඳ පුරෝකථනය කිරීමේ හැකියාව දූෂිත ආණ්ඩුකරණය නිසා අඩු වේ. ව්‍යාපාරික පරිසරයේ සාධාරණත්වය ද අඩු වේ. දූෂණය නිසා කුලී සොයා යාමේ සංස්කෘතිය ශක්තිමත් වේ.

- ව්‍යාපාර වඩාත් අවධානය යොමු කරනුයේ ඵලදායිතාව ඉහළ නැංවීමට හෝ නව්‍යතාවන් හඳුන්වාදීමට හෝ නොව දේශපාලන අනුග්‍රහ ලබා ගැනීම කෙරෙහි ය. තරගකාරී පසුබිමක් බිහිවීම මේ නිසා වැළැකේ. ආර්ථිකයේ ගතික අංශවල වර්ධනය මන්දගාමී වන අතර ව්‍යවසායක ක්‍රියාකාරකම් මන්දගාමී වනු ඇත.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි)**

**(මුළු ලකුණු 05යි)**

(iv) ශ්‍රම වෙළෙඳපොළට එල්ල වී ඇති අභියෝග :

- ශ්‍රම සැපයුම අඩු වීමේ උපනතියක් පෙන්වයි. උපත් අනුපාතිකය අඛණ්ඩවම පහළ වැටීම සහ ජනගහනය වයස්ගත වීමත් සමඟ වැඩකරන වයසේ ජනගහනයේ ප්‍රමාණය හැකිලෙමින් පවතී. තරුණ ශ්‍රමිකයින් වෙළෙඳපොළට ප්‍රවේශ වනුයේ ඉතා අඩුවෙනි. මේ නිසා ශ්‍රම හිඟයක් ඇති විය හැකි ය. විශේෂයෙන් ම තාක්ෂණය, නිෂ්පාදන කර්මාන්ත සහ සේවා අංශය වැනි තරුණ ශ්‍රමය මත වැඩි රැඳියාවක් දක්වන අංශවලට මෙය ගැටලුවක් වනු ඇත.

- වැඩිහිටි ජනගහනය වැඩි වීමත් වැඩකරන වයසේ ජනගහනය අඩුවීමත් නිසා යැපුම් අනුපාතය ඉහළ නගිනු ඇත. ළමයින් සහ වැඩිහිටියන් නඩත්තු කිරීමේ බර දරා සිටින වැඩකරන වයසේ ජනගහනයට මෙය දැඩි පීඩනයක් ඇති කරයි.

- ඵලදායිතාව අඩු වීම : ශ්‍රම බලකාය වයසටයත්ම, ශාරීරික ශක්තිය අඩු වීම, තාක්ෂණික වෙනස්කම්වලට අනුවර්තනය වීම මන්දගාමී වීම සෞඛ්‍ය සම්බන්ධ ගැටලු මත සේවයට නොපැමිණීම් ඉහළ යාම වැනි සාධක හේතුවෙන් ශ්‍රම ඵලදායිතාව පහළ වැටිය හැකි ය.

- අධි තාක්ෂණික නිපුණතා සහ නව්‍යතා අවශ්‍යකරන ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවත්නා කර්මාන්ත ක්ෂේත්‍රයේ ශ්‍රම ඉල්ලුම සපුරාලීමේ දී වැඩිහිටි ශ්‍රම බලකායට ඉමහත් ආයාසයක් දැරීමට සිදු විය හැකි ය.

- ශ්‍රම හමුදාවේ කුසලතා නොගැලපීම : ඩිජිටල් තාක්ෂණය, කෘත්‍රිම බුද්ධිය හෝ හරිත බලශක්ති වැනි නැගී එන අංශ සඳහා අවශ්‍යකරන කුසලතා වැඩිහිටි සේවකයන්ට නොතිබිය හැකි ය. නැවත පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා සැලකිය යුතු ආයෝජනයක් නොසිදු වුවහොත් මෙම කුසලතා පරතරය ආර්ථික වර්ධනයට විශාල බාධාවක් විය හැකි ය.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)**

රාජ්‍ය මූල්‍යයට බලපෑම :

- සමාජ සුබසාධනය සඳහා ආණ්ඩුවේ වියදම් ඉහළ යනු ඇත. වැඩිවන වැඩිහිටි ජනගහනයත් සමඟ විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ඇති ඉල්ලුම වැඩි වෙමින් පවතී.

- ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ක්‍රමය දැනටමත් දැඩි මූල්‍ය පීඩනයකට මුහුණ දී සිටින අතර වැඩි පිරිසක් විශ්‍රාම ගොස් වැඩි කාලයක් ජීවත් වන විට මේ තත්ත්වය වඩාත් බරපතල වනු ඇතැයි



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අපේක්ෂා කෙරේ. මෙම ඉහළ යන විශ්‍රාම වැටුප් වගකීම් සපුරාලීම සඳහා රජයට තම අයවැයෙන් විශාල කොටසක් වෙන් කිරීමට සිදුවනු ඇත.

- සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඉහළ යාම : වයස්ගත ජනගහනයට වැඩි සෞඛ්‍ය සේවා අවශ්‍ය කෙරේ. විශේෂයෙන් හෘද රෝග, දියවැඩියාව, ඩිමෙන්ෂියාව වැනි නිදන්ගත තත්ත්වයන් සඳහා මිල අධික වෛද්‍ය ප්‍රතිකාර නිතර නිතර අවශ්‍ය වන බැවින් මහජන සෞඛ්‍ය පද්ධති දැඩි ආතතියකට මුහුණ දෙනු ඇත. අවසාන වශයෙන් එම පීඩනය එල්ල වන්නේ රාජ්‍ය මූල්‍ය මත ය.

- රාජ්‍ය බදු ආදායම් පහළ යාම : වැඩකරන වයසේ ජනගහනය හැකිලීම යන්නෙන් අදහස් වන්නේ බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව අඩු වීම බැවින් රජයට ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව අඩු වනු ඇත.

- අයවැය හිඟය ඉහළ යාම : රාජ්‍ය වියදම් ඉහළ යාමත් බදු ආදායම් හැකිලීමත් නිසා විශාල අයවැය හිඟයකට මගපාදයි. ශ්‍රී ලංකාව දැනටමත් සැලකිය යුතු රාජ්‍ය ණය බරකට උර දී සිටින බැවින් මෙම ජන විකාශන පීඩනයන් රාජ්‍ය මූල්‍ය ස්ථාවර කිරීම් සහ ණය බර අඩු කර ගැනීමට දරන ප්‍රයත්න තවදුරටත් සංකීර්ණ කරනු ඇත.

- පොදු යටිතල පහසුකම් සහ සේවා මත පීඩනයක් ඇති වේ. ජනගහන වයස් ගත වන විට උපකාරක ජීවන පහසුකම්, සාත්තු නිවාස, විශේෂිත ප්‍රවාහන සේවා වැනි වැඩිහිටියන්ට ගැළපෙන පොදු යටිතල පහසුකම් සහ සේවා සඳහා වැඩි ඉල්ලුමක් පවතිනු ඇත. මෙම සේවා පුළුල් කිරීමට ද සැලකිය යුතු ආයෝජනයක් කිරීමට රජයට සිදු වේ.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)**

**(මුළු ලකුණු 06යි)**

**10.** **(i)** ශ්‍රී ලංකාව වර්තමානයේ අත්විඳිමින් සිටින ආර්ථික අර්බුදයට බලපා ඇති ප්‍රධාන සාධක කෙටියෙන් සඳහන් කරන්න. **(ලකුණු 04යි)**

**(ii)** වත්මන් ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාවට සහාය වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය ආයතන ඉටුකරමින් සිටින කාර්යභාරය කුමක් ද? **(ලකුණු 04යි)**

**(iii)** ඉදිරි වසර පහක කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීමට සහ තිරසාර වර්ධනයක් කරා යොමු කිරීමට ආමන්ත්‍රණය කළ යුතු ප්‍රධාන අභියෝග මොනවා ද? **(ලකුණු 06යි)**

**(iv)** ඩිජිටල් යටිතල පහසුකම් දියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය, ආර්ථික කාර්යක්ෂමතාව හා ගෝලීය තරගකාරීත්වය ඉහළ නැංවිය හැක්කේ කෙසේ ද? **(ලකුණු 06යි)**

10. (i) වර්තමාන ආර්ථික අර්බුදයට බලපා ඇති ප්‍රධාන හේතු :

- ශ්‍රී ලංකාව වර්තමානයේ අත්විඳිමින් සිටින ආර්ථික අර්බුදය අභ්‍යන්තර වැරදි කළමනාකරණයේ සහ බාහිර කම්පනවල එකතුවක ප්‍රතිඵලයකි. අර්බුදයට දායක වී ඇති ප්‍රධාන සාධක පහත දැක්වේ.

- කළමනාකරණය කළ නොහැකි විදේශ ණය සම්භාරය : ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභයක් ලබා නොදුන් යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අධික ණය ගැනීම් ඔස්සේ රටට දරාගත



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

නොහැකි මට්ටමේ විදේශ ණය තොගයක් සමුච්චනය විය. මේ මගින් ගෙවුම් ශේෂ ගැටලු ඇති කරමින් ණය සේවා පිරිවැය වැඩි විය. 2022 දී ශ්‍රී ලංකාව ඉතිහාසයේ ප්‍රථම වතාවට ණය ආපසු ගෙවීම් පැහැර හැරියේ ය.

- විදේශ විනිමය හිඟය : Covid - 19 වසංගතය හේතුවෙන් සංචාරක ව්‍යාපාරය සහ විදේශ ප්‍රේෂණ පහළ වැටීමත් අති විශාල විදේශ ණය තොගයක් සේවා කිරීම් අවශ්‍යතාවක් නිසා විදේශ මුදල් වල උග්‍ර හිඟයක් ඇති විය. රටේ විදේශ සංචිත සිඳී ගියේ ය. ඉන්ධන, ආහාර සහ ඖෂධ වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට රටට ඇති හැකියාව මේ මගින් බිඳ වැටුණේ ය.

- Covid - 19 වසංගතය : ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දෙන ප්‍රධාන මූලාශ්‍රයන් දෙකක් වූ සංචාරක ව්‍යාපාරය සහ අපනයන ක්ෂේත්‍ර Covid වසංගතය නිසා කඩාකප්පල් විය. විරැකියාව සහ දරිද්‍රතා මට්ටම් ඉහළ යාමට ඒවා බලපෑවේ ය.

- වැරදි ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග : රසායනික පොහොර තහනම් කිරීම මගින් කාබනික ගොවිතැනට හදිසියේ මාරුවීමට ගත් තීරණය වැනි දුර්වල ආර්ථික කළමනාකරණය කෘෂිකාර්මික ඵලදායිතාව තිබුණු ලෙස පහත වැටීමට හේතු විය. එසේම 2019 දී හඳුන්වාදුන් බදු කපා හැරීම මගින් රාජ්‍ය ආදායම පහළ හෙළීම රාජ්‍ය මූල්‍ය හිඟය උග්‍ර කළේ ය. විනිමය අනුපාතිකය කළමනාකරණය කිරීම පිළිබඳව ද රජයේ ප්‍රතිපත්ති දෝෂ සහිත විය. අධික ලෙස අධිතක්සේරු වූ විනිමය අනුපාතිකයක් කෘත්‍රිම ලෙස පවත්වාගෙන යාමට උත්සාහ කළේ ය. එහි ප්‍රතිඵලය වූයේ තිරසාර නොවන විනිමය අනුපාතික පාලන තන්ත්‍රයක් ඇතිවීමත් රටේ විදේශ විනිමය සංචිතය අතිශය පහළ මට්ටමකට අඩු වීමත් ය.

- උද්ධමනය ඉහළ යාම : ව්‍යවහාර මුදල ක්ෂයවීමත් සැපයුම් හිඟයත් විසින් මෙහෙයවනු ලබන ඉහළ උද්ධමනය මහජනයාගේ මිල දී ගැනීමේ ශක්තිය බාදනය කළ අතර ජීවන තත්ත්වය ඉතා අයහපත් කරවී ය. රටපුරා පැතුරුණු විරෝධතා ව්‍යාපාර ඇති කළේ ය. අයවැය හිඟය පියවීමට මහ බැංකුව විශාල වශයෙන් මුදල් මුද්‍රණය කිරීම නිසා උද්ධමනය ඉතා ඉහළ නැංගේ ය.

- ගෝලීය සිදුවීම්වල බලපෑම : Covid - 19 වසංගතය සංචාරක කර්මාන්තය විනාශ කළ අතර විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයක් උපයා ගැනීම් අවස්ථාව රටට අහිමි විය. එලෙසම විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ද අඩු විය. රුසියානු - යුක්‍රේන යුද ගැටුම් බලශක්ති සහ ආහාර මිල උග්‍ර කළ අතර ඉන්ධන හා තිරිඟු වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ශ්‍රී ලංකාවේ ආනයන වියදම් ශීඝ්‍රයෙන් ඉහළ නැංගේ ය.

- ආණ්ඩුකරණය සහ දූෂණය : දේශපාලන නායකත්වයේ නිරන්තර ව වෙනස්වීම් හටගැනීමත් සුසංයෝගී ආර්ථික ප්‍රතිපත්ති නොමැති වීමත් නිසා රජය කෙරෙහි විශ්වාසය ද බිඳ වැටුණි. වැරදි ලෙස අරමුදල් කළමනාකරණය කිරීම, විනිවිදභාවය නොමැතිකම, සැකසහිත යටිතල පහසුකම් ආයෝජන ආර්ථික දුෂ්කරතා උග්‍ර කළේ ය. දුර්වල ආයතනික ව්‍යුහය ද බලපෑවේ ය. රාජ්‍ය මූල්‍යය හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා පාලනකරණයේ පැවැති දුර්වලතා, අර්බුදයට ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීමට රටට ඇති හැකියාව දුර්වල කළේ ය.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු හතරකට ලකුණු 04යි)**

**(මුළු ලකුණු 04යි)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) ජාත්‍යන්තර මූල්‍ය ආයතන ශ්‍රී ලංකාව සඳහා ඉටු කරමින් සිටින කාර්යභාරය :

- ජාත්‍යන්තර මූල්‍ය ආයතන මූල්‍ය ආධාර, ප්‍රතිපත්ති මග පෙන්වීම් සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උත්සාහයන් ඔස්සේ ආර්ථික අර්බුදයෙන් ගොඩඒම පිණිස ශ්‍රී ලංකාවට විශාල සහායක් ලබා දී ඇත.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාවට තම ආර්ථිකය ස්ථාවර කර ගැනීම පිණිස තීරණාත්මක මූල්‍යාධාර පැකේජයක් ලබා දුනි. 2023 මාර්තු මාසයේ දී සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඩොලර් බිලියන 3ක විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) ලබාදුනි. මෙම වැඩසටහන මගින් අපේක්ෂා කරනු ලැබුවේ දුප්පතුන් සහ අවදානමට ලක් විය හැකි ජන කොටස් මත ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීමත් මූල්‍ය ස්ථාවරත්වය රැක ගැනීමත් ආණ්ඩුකරණය ශක්තිමත් කිරීමත් ය.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා සඳහා පහසුකම් සපයා ඇති අතර ණයහිමි රටවලට සහ බැඳුම්කර හිමියන්ට ඒ සඳහා සාකච්ඡාවල නිරත වන ලෙස ඉල්ලා ඇත. මෙම ක්‍රියාවලිය ඔස්සේ ශ්‍රී ලංකාවට ණය ආපසු ගෙවීමේ හැකියාව සහතික කිරීමටත් අත්‍යවශ්‍ය සේවා සහ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය සම්පත් නිදහස් කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

- ආර්ථික අර්බුදය හමුවේ ලෝක බැංකුව ද ශ්‍රී ලංකාවට සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කළේ ය. ආර්ථිකය ස්ථාවර කිරීමත්, අවදානමට ලක් විය හැකි ජනතාව ආරක්ෂා කිරීමත් අරමුණු කර ගනිමින් මූල්‍ය ආධාර සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඔස්සේ විශාල සහායක් ලබා දී ඇත.

- ඔරොත්තු දීම, ස්ථාවරත්වය සහ ආර්ථික හැරවුම (RESET) වැඩසටහන ඔස්සේ ලෝක බැංකුව 2023 වර්ෂයේ දී ඩොලර් මිලියන 500ක් ශ්‍රී ලංකාවට ලබාදුනි. සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ සමාජ ආරක්ෂණය ශක්තිමත් කිරීම පිණිස එම අරමුදල් ලබාදුනි.

- 2024 දී ද ලෝක බැංකුව RESET වැඩසටහන යටතේ ඩොලර් මිලියන 200ක් ශ්‍රී ලංකාවට ලබාදුනි. ආණ්ඩුකරණය සහ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම පිණිස එම මූල්‍ය ආධාර අරමුණු කර තිබේ.

- 2022 වර්ෂයේ දී විදේශ විනිමය නොමැතිව ශ්‍රී ලංකාව අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳ දැඩි හිඟයකට මුහුණපා සිටිය දී ලෝක බැංකුව එවකට ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘති සඳහා වෙන්කොට තිබූ මුදල් LP ගෑස්, පොහොර ඇතුළු හදිසි අවශ්‍යතා සපුරා ගැනීම පිණිස ලබා දෙන ලදී.

- 2023 දී ජාත්‍යන්තර මූල්‍ය සමායතනය (IFC) ආහාර, ඖෂධ සහ පොහොර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකාවේ බැංකුවලට ඩොලර් මිලියන 400ක් ලබා දෙන ලදී. තීරණාත්මක සැපයුම් අඛණ්ඩ ව ලබා ගැනීම සහසතික කිරීම එහි අරමුණ විය.

- ආසියානු සංවර්ධන බැංකුව ද (ADB) ආර්ථිකය ස්ථාවර කිරීම සහ මූල්‍ය අංශය ශක්තිමත් කිරීම අරමුණු කරගත් මූල්‍ය ආධාර සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඔස්සේ ශ්‍රී ලංකාවට සහාය



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ව්‍යාපාරික පරිසරය වැඩි දියුණු කිරීමට හැකි වේ.

- පෞද්ගලික අංශයේ වර්ධනය ඉහළ නැංවීම : පෞද්ගලික අංශයේ ආයෝජන හා ව්‍යවසායකත්වය සඳහා හිතකර පරිසරයක් ගොඩනැංවීමත් නියාමන ප්‍රතිසංස්කරණ කිරීමත්, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය පහසු කිරීමත් ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒමටත් රැකියා අවස්ථා බිහි කිරීමටත් අත්‍යවශ්‍ය වේ.

- සමාජ අසමානතා ආමන්ත්‍රණය කිරීම : දිළිඳුකම සහ අසමානතා අවම කිරීම පිණිස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තිරසාර සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. කාර්යක්ෂම සමාජ ආරක්ෂණ ජාල සහ ඉලක්කගත ආධාර වැඩසටහන් මගින් අර්බුදයට පීඩාවට පත් ජනකොටස් සඳහා උපකාර කළ හැකි ය.

- පාරිසරික තිරසාරත්වය : ආර්ථික සැලසුම් කරන ක්‍රියාවලිය තුළට තිරසාරභාවය අන්තර්ගත කළ යුතු වේ. හරිත බලශක්තිය, තිරසාර කෘෂි කර්මය, සංරක්ෂණ උත්සාහ අවධාරණය කිරීම දිගු කාලීන වර්ධනය සහ ඔරොත්තු දීමේ ශක්තිය වර්ධනය කරයි.

- කලාපීය සහ ගෝලීය වෙළෙඳ සම්බන්ධතා වර්ධනය කිරීම : වෙළෙඳ සබඳතා ශක්තිමත් කිරීම සහ නව වෙළෙඳපොළ ගවේෂණය මගින් අපනයන විවිධාංගීකරණය කිරීමේ ප්‍රයත්නයට අනුබල ලැබේ. වෙළෙඳ ගිවිසුම් සහ හවුල්කාරීත්වයක් ගොඩනගා ගැනීම නව වෙළෙඳපොළවල් සඳහා ප්‍රවේශය ලබා ගැනීමේ දී වැදගත් වේ.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු හයකට ලකුණු 06යි)**
**(මුළු ලකුණු 06යි)**

(iv) ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සහ තරගකාරිත්ව හැඩ ගැන්වීමේ දී ඩිජිටල් යටිතල පහසුකම් මට්ටම තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි.

- සම්බන්ධතාව සහ ප්‍රවේශ්‍යතාව (Connectivity and accessibility) වැඩි දියුණු කිරීම ශක්තිමත් ඩිජිටල් යටිතල පහසුකම් නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ සියල්ල ආවරණය කරමින් සම්බන්ධතා වැඩි දියුණු කරයි. එමගින් ව්‍යාපාරික ආයතනවලට පුද්ගලයන්ට තොරතුරු සේවා සහ වෙළෙඳපොළ කරා ප්‍රවේශවීමට හැකියාව ලැබේ.

- ඵලදායිතාව ඉහළ නැංවීම : ඩිජිටල් මෙවලම් සහ තාක්ෂණය මගින් නිෂ්පාදන ක්‍රියාවලීන් විධිමත් කිරීමට, කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ ව්‍යාපාරික පිරිවැය අඩු කිරීමට හැකි ය. මෙමගින් නිමැවුම වැඩි වන අතර තරගකාරිත්වය ඉහළ නගී.

- ඊ-වාණිජ්‍යය (E-Commarce) සහ වෙළෙඳාම සඳහා පහසුකම් සැපයීම : ශක්තිමත් ඩිජිටල් යටිතල ව්‍යුහයක් ඊ-වාණිජ්‍යයේ වර්ධනයට සහාය වන අතර, ව්‍යාපාරික අංශයට දේශීය සහ ජාත්‍යන්තර පුළුල් වෙළෙඳපොළ කරා ප්‍රවේශ විය හැකි ය.

- විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම : දියුණු ඩිජිටල් යටිතල පහසුකම් සහිත රටවල් බොහෝ විට විදේශීය ආයෝජනය සඳහා වඩාත් ආකර්ශණීය වේ.

- නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය කිරීම : දියුණු ඩිජිටල් පද්ධතියක් මගින් ඩිජිටල් මෙවලම්, සම්පත් සහ ජාල සඳහා ප්‍රවේශය ලබා දීමෙන් නවෝත්පාදන සහ ව්‍යවසායකත්වයට සහාය වේ.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- රාජ්‍ය සේවා සහ ආණ්ඩුකරණය කාර්යක්ෂම වීම : ඩිජිටල් යටිතල පහසුකම් මගින් රාජ්‍ය සේවා ලබා දීම, වැඩි දියුණු කළ හැකි අතර ඒවා වඩාත් කාර්යක්ෂම කිරීමටත් ඒවා වෙත පහසුවෙන් ප්‍රවේශවීමටත් හැකි වේ. විද්‍යුත් ආණ්ඩුකරණ (E-governance) ක්‍රියාමාර්ග ඔස්සේ විනිවිදභාවය වැඩි කිරීම, දූෂණය අවම කිරීම, පුරවැසි සහභාගීත්වය වැඩි කිරීමට හැකි වේ.

- අධ්‍යාපනික අවස්ථා පුළුල් කිරීම : වැඩි දියුණු ඩිජිටල් යටිතල පහසුකම් මගින් අධ්‍යාපනය සහ පුහුණුවීම් සඳහා ප්‍රවේශය ලබා දීම ඔස්සේ ශ්‍රම හමුදාවේ නිපුණතා උසස් කළ හැකි ය.

- ඩිජිටල් මූල්‍ය සඳහා සහාය වීම : ඩිජිටල් මූල්‍ය සේවා සඳහා ප්‍රවේශ වීම වැඩි දියුණු කිරීම තුළින් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට පහසුවෙන් මූල්‍ය, ඉතුරුම් සහ රක්ෂණ සේවා සඳහා ප්‍රවේශ විය හැකි ය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සවිබල ගැන්විය හැකි ය.

- දත්ත මත පදනම් ව තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් වේ. ඩිජිටල් පහසුකම් මගින් දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම ව්‍යාපාරික තීරණ ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කරයි. දැනුවත් තීරණ ගැනීමට හැකි වේ.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු හයකට ලකුණු 06යි)**

**(මුළු ලකුණු 06යි)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/